71
NSFAR-94

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

1994

ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය

இலங்கை இயற்கைவள, சக்தி விஞ்ஞான அதிகாரசபை

ATURAL RESOURCES, ENERGY & SCIENCE AUTHORITY OF SRI LANKA

ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති
හා විද්‍යා අධිකාරිය,
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 7.
1996-06-07

ගරු ඇමති තුමා,
විද්‍යා තාක්ෂණ හා මිනිස් සම්පත් සංවර්ධන
අමාත්‍යාංශය,
අංක 320, ටී.බී. ජයා මාවත,
කොළඹ - 10.

ගරු ඇමති තුමනි,

1994 ජනවාරි 1 දින සිට 1994 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරියේ වාර්ෂික වාර්තාව

1981 අංක 78 දරණ ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරි පනතේ 16 (III) වන වගන්තිය අනුව 1994 ජනවාරි 1 දින සිට 1994 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත් ,බලශක්ති හා විද්‍යා අධිකාරියේ, වාර්ෂික වාර්තාව පහත සඳහන් ලේඛණද සමග ඔබ තුමන් වෙත ගෞරව පූර්වකව ඉදිරිපත් කරමි.

(අ) පරීක්ෂිත ආදායම් හා වියදම් ගිණුමේ පිටපතක්.
(ආ) පරීක්ෂිත ශේෂ පත්‍රයේ පිටපතක්.
(ඇ) විගණකාධිපතිගේ වාර්තාව.

මෙයට - යටහත්,

(අත්සන)

මහාචාර්ය ප්‍රියානි ඊ. සොයිසා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය.

ප ටු න

1.0	1994 වර්ෂය තුළ ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරියේ සාමාජිකයින්.	..1
2.0	ප්‍රධාන කාර්ය මණ්ඩලය.	2
3.0	විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ස්වශක්තිය තංවාලීමේ ක්‍රියා මාර්ග	4
4.0	විද්‍යාත්මක පර්යේෂණ සඳහා අනුග්‍රහය .	5
5.0	පර්යේෂණ සහ සම්බන්ධීකරණ කටයුතු.	5
6.0	ජාතික වශයෙන් වැදගත්වන වාර්තා ප්‍රකාශන සහ වැඩ සටහන්.	6
7.0	විද්‍යාත්මක තොරතුරු හා සම්බන්ධ කටයුතු.	8
8.0	ජාත්‍යන්තර විද්‍යාත්මක කටයුතු.	10
9.0	වැදගත් පර්යේෂණ නිගමන .	11
10.0	ශේෂ පත්‍රය .	42
11.0	විගණකාධිපති වාර්තාව	54
12.0	විගණකාධිපති වාර්තාව පිළිබඳ අධිකාරියේ අදහස් දැක්වීම	73

සටහන් ලැයිස්තුව.

I	වන සටහන	තරේසා අධිකාරියේ අනුග්‍රහයෙන් දෙන ලද ප්‍රදාන	31
II	වන සටහන	විදේශීය නියෝජිතායතනයන්හි අනුග්‍රහයෙන් දෙන ලද ප්‍රදාන	32
III	වන සටහන	1994 දෙන ලද නව ප්‍රදාන	33

වාර්ෂික වාර්තාව

1994

1.0 **වර්ෂය තුලදී ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ සාමාජිකයින්.**

1.1 1994 ජනවාරි 01 දින සිට 1994 සැප්තැම්බර් 26 දින දක්වා මණ්ඩලයේ සාමාජිකයින්.

මහාචාර්ය ප්‍රියානි ඊ. සොයිසා මහත්මිය
මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා
මහාචාර්ය සී. දහනායක මහතා
මහාචාර්ය එන්. කෝදාගොඩ මහතා
මහාචාර්ය ආර්. රාමසාමි මහතා
ආචාර්ය ඩී.ජේ.ටී. සියඹලාපිටිය මහතා
ඩබ්. කේ. වික්‍රමාරච්චි මහතා
ජී. ආර්. ගුණවර්ධන මහතා

1.2 1994 සැප්තැම්බර් 27 දින සිට 1994 දෙසම්බර් 31 දින දක්වා මණ්ඩලයේ සාමාජිකයින්.

මහාචාර්ය ප්‍රියානි ඊ. සොයිසා මහත්මිය
මහාචාර්ය සී. දහනායක මහතා
මහාචාර්ය එන්. කෝදාගොඩ මහතා
ආචාර්ය තිස්ස විතාරණ මහතා
ආචාර්ය ආර්.ඕ.බී. විජේසේකර මහතා
ආචාර්ය සී.ආර්. පානබොක්ක මහතා
ආචාර්ය ඒ. එස්. ඉඳුරුව මහතා
ආචාර්ය උපාලි පිලපිටිය මහතා
ගොඩ්ෆ්‍රි ගුණතිලක මහතා
සී.පී. සේනාධිපති මහතා

2.0 ප්‍රධාන කාර්ය මණ්ඩලය.

අධ්‍යක්ෂ ජනරාල්.

මහාචාර්ය ප්‍රියානි ඒ. සොයිසා මහත්මිය - එම්.ඩී. (ලංකා) ඩී.එස්.සී (රුහුණ)
එෆ්.ආර්.සී.පී. (එඩින්බරෝ සහ ලන්ඩන්)
එෆ්.සී.සී.පී., ඩීසීඑච්. (එංගලන්තය)

අධ්‍යක්ෂක විද්‍යාත්මක කටයුතු

එස්.පී. ප්‍රේලිස් මහත්මිය - බී.එස්සී. ගෞ(ලංකා)
එම්.එස්සී. (ශ්‍රී ලංකා)

එම්. වොට්සන් මහතා බී.එස් සී. (ලංකා) එම්.ෆිල් (ලන්ඩන්)

සහකාර අධ්‍යක්ෂක විද්‍යාත්මක කටයුතු

ආර්.එම්.ඩබ්. අමරදාස මහතා බී.එස් සී.(ශ්‍රී ලංකා
ඩබ්. ආර්. එන්. සන්දනායක මහත්මිය බී.එස් සී. (ශ්‍රී ලංකා)
එම්.එස් සී .(ශ්‍රී ලංකා)

විද්‍යාත්මක නිලධාරීන්

එච්.ඒ.යූ. අමරසිංහ මෙනෙවිය බී.එස්සී. (ශ්‍රී ලංකා) එම්.එස්සී.(ශ්‍රී ලංකා)
බී.එම්.සී.කේ. බස්නායක මහතා බී.එස්සී.(ශ්‍රී ලංකා)
ඒ. ඩබ්. ජේ. කරුණාසිංහ මහතා බී. එස්සී. (ශ්‍රී ලංකා)
එස්. පී. ස්පෙන්සර් මෙනෙවිය බී. එස්සී. ගෞ (ශ්‍රී ලංකා)
එම්.එස්සී. (ලන්ඩන්)

එස්. එල්. තිලකරත්න මහත්මිය බී. ඒ. (ලංකා)
පී. එන්. උල්ලුවිස්සේවා මහත්මිය(වැටුප් රහිත නිවාඩු) එම්.එස්සී(රුසියානු ස.ස.සංගමය)
එම්.එස් සී.(ජපානය)
එස්. අයි. වික්‍රමසිංහ මහත්මිය (වැටුප් රහිත නිවාඩු) බී.එස්සී ගෞ. (ශ්‍රී ලංකා)
එම්.එස් සී. (ශ්‍රී ලංකා)
ආර්. විජේරත්න මහත්මිය බී. එස් සී ගෞ (ශ්‍රී ලංකා)
සී. ජී. යාපා මහත්මිය බී.එස් සී ගෞ (ශ්‍රී ලංකා)
ඩබ්. බී. යාපා මහතා බී. එස් සී (ශ්‍රී ලංකා)
එම්. ෆිල් . (ශ්‍රී ලංකා)

ප්‍රලේඛන නිලධාරි

ආර්.පී. හතුරුසිංහ මිය	බී.එස්සී (ශ්‍රී ලංකා)
වී. එන්. පෙරේරා මිය	බී.එස්සී. (ශ්‍රී ලංකා)
ඒ.ඒ.ඒ. විජයන්ති මිය	බී.එස්සී.(ශ්‍රී ලංකා)
වී. එන්. ධර්මරත්න මිය	ශ්‍රී ලංකා පුස්තකාල සංගම් ආශ්‍රය සාමාජිකත්වය.

සහකාර පරිපාලන ලේකම්

එස්.පී. දිසානායක මයා	බී.එස්සී. (ව්‍යා. ක.) (ශ්‍රී ලංකා)

ගණකාධිකාරි

කේ.සී.ජේ.ටී.කේ. ප්‍රනාන්දු මෙනවිය . ඒ.සී.එම්.ඒ.
එම්.එච්.එම්.එස්. හමීඩ් මයා.
ඒ.සී.එම්. ඩැනියෙල් මයා.

රහස්‍ය ලේකම්

එස්. රත්නායක මිය
එස්.පී. වීජේ සිංහ මිය

මාණ්ඩලික සහකාර (පරිපාලන)

එස්. ගල්කැටිය මයා

මුද්‍රණ අධිකාරි

කේ.පී. සේනානායක මයා

එක් තනතුරක් යටතේ එක් නිලධාරියෙකුට වැඩි සංඛ්‍යාවක් සඳහන් වන අවස්ථාවන්හිදී ඉංග්‍රීසි අකාරාදි අනුපිළිවෙලින් නම් සඳහන් කර ඇත.

3. විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ ඩාශක්තිය නංවාලීමේ ක්‍රියා මාර්ග

× සම්මන්ත්‍රණ සහ වැඩමුළු

නව දැනුම බෙදා ගැනීම, කාලීන කරලීම සහ ඩාශක්තිය නංවාලීම සඳහා 1994 වර්ෂය තුළ පහත සඳහන් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

× "පර්යේෂණ පැතිකඩ" පිළිබඳ තේමා සම්මන්ත්‍රණයක් 25-11-94 දින පැවැත්විණ. පර්යේෂණ පිළිබඳ විවිධ අංශයනට අදාලව දේශන පහක් පැවැත්විණ. තරේසා කාර්ය මණ්ඩලය ඇතුළු 65 දෙනෙක් සහභාගි වූ මෙම සම්මන්ත්‍රණය පුවත්පත්වලද වාර්තා විය.

× භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ තේමා සම්මන්ත්‍රණයක් 1994 දෙසැම්බර් 2 වන දින පවත්වන ලදී. කථිකයින් 6 දෙනෙක් තමන් මෙම තොරතුරු පද්ධතිය ආධාරකරගෙන මින් කළ කටයුතු ඉදිරිපත් කළහ. මෙම සම්මන්ත්‍රණයට පුද්ගලයින් 80 දෙනෙක් සහභාගි වූහ.

× මහජනයා දැනුවත් කිරීම සඳහා පහත සඳහන් ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්විණ.

× "ආහාර සහ පෝෂණය", 1994 නොවැම්බර් 5 වන දින - කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය - දේශන 03 ක් ද සෑම දේශනයකටම පසුව සාකච්ඡාවක්ද පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයට 260 දෙනෙක් සහභාගි වූහ.

× "ඒඩ්ස් සහ සමාජයීය ගැටළු" - 1994 දෙසැම්බර් 06 දින, කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය දේශන 05 ක් පවත්වන ලද අතර, සෑම දේශනයක් අවසානයේම සාකච්ඡාවක් පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයට 300 දෙනෙක් සහභාගි වූහ.

× ආහාර සහ පෝෂණය - 1994 දෙසැම්බර් 11 වන දින - නිදහස් වෙළඳ කලාපය කටුනායක, දේශන තුනක්ද, සෑම දේශනයක්ම අවසානයේ සාකච්ඡාවක්ද පැවැත්විණ. පුද්ගලයින් 176 දෙනෙක් සහභාගි වූහ.

× "සමාජ ගැටළු" - 1994 දෙසැම්බර් 31 වන දින ආනන්ද මහා විද්‍යාලය ඇල්පිටිය දේශන තුනක් සහ සෑම දේශනයක්ම අවසානයේ සාකච්ඡාවක්ද පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයට පුද්ගලයින් 250 දෙනෙක් සහභාගි වූහ.

× "සංරක්ෂණය සඳහා පා තබමු" සංවිධානය සහ ඒකාබද්ධව 1994 දෙසැම්බර් 12 - 16 දක්වා කාලය තුල, පාරිසරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා ක්ෂේත්‍ර වැඩ මුළුවක් පවත්වන ලදි. ගුරුවරුන් 21 දෙනෙක් සහ කථිකයින් 08 දෙනෙක් මෙම වැඩමුළුවට සම්බන්ධ වූහ. ඊට සහභාගි වූවනට කුඩා පොත් සහ පෝස්ටර් බඳු අධ්‍යාපනික උපකාරක ද්‍රව්‍ය ද සපයන ලදි.

× පහත සඳහන් තේමාවන් යටතේ, සමාජ ප්‍රවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණ තුනක්, ප්‍රමුඛ පෙළේ සමාජ විද්‍යාඥයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.

- සමාජ ඒකාග්‍රතාව
- දරිද්‍රතාව
- සේවා වියුක්තිය

× නරේසා පර්යේෂණ ආධාර ලාභීන්ගේ පර්යේෂණ කටයුතු ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ මෙහෙයුම් කමිටු මගින් සම්මන්ත්‍රණ පවත්වන ලදි. මේවායේ අරමුණ වූයේ පර්යේෂණ කටයුතු නියාමනයට අමතරව සාකච්ඡා සඳහා අවස්ථාවක්ද උදාකර දීමයි.

4.0 විද්‍යාත්මක පර්යේෂණ සඳහා අනුග්‍රහය

සාමාන්‍ය පිළිවෙතට අනුව, ජාතික පුවත්පත් වල දැන්වීම් පළකිරීමෙන්, පර්යේෂණ ආධාර ප්‍රදානය සඳහා අයදුම්පත් කැඳවන ලදි. පර්යේෂණ ආධාර ප්‍රදාන යෝජනා ක්‍රමය පිළිබඳ විස්තර, අංක 1, 2 සහ 3 දරන සටහන් මගින් දක්වා ඇත.

5. පර්යේෂණ සහ සම්බන්ධීකරණ කටයුතු

× ජාත්‍යන්තර ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය (ICGEB)හා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනට ඉදිරිපත් කිරීම සඳහා නරේසා ආයතනය මගින් ව්‍යාපෘති යෝජනා දෙකක් තෝරා ගන්නා ලදි.

× <u>සත්ත්ව සහ ශාක වර්ග නීති විරෝධී ලෙස එක්රැස් කිරීම සහ අපනයනය</u>

සත්ව සහ ශාක සම්පත්, නීති විරෝධී ලෙස එක්රැස් කිරීම සහ අපනයනය පිළිබඳ ප්‍රශ්නය අදාල මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්ගේ ඉල්ලීම මත නරේසා ආයතනය මගින් අධ්‍යයනය කරන ලදි. සත්ව ආරක්ෂණ ආඥාපනත ඇතුළුව මෙම ප්‍රශ්නයට අදාල සියළුම අංශ සවිස්තරව අධ්‍යයනය කෙරිණ. සංදේශයක් පිළියෙල කර

විද්‍යා හා තාක්ෂණ විද්‍යාව පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය සහ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය මගින් 1994 ජුලි මාසයේදී ගරු අග්‍රාමාත්‍ය වරිය වෙතද ගරු ජනාධිපතිනිය වෙතද ඉදිරිපත් කරන ලදී. 1994 දෙසැම්බර් මාසයේදී ළමය ගරු විද්‍යාත්මක සහ මානව සම්පත්, සංවර්ධන ඇමතිවරයා වෙතද එම ඇමති වරයා මගින් ගරු ජනාධිපති වෙතද, පිරිනමන ලදී. මෙහි පිටපත් , පාරිසරික අමාත්‍යාංශය වෙත යවන ලදී. ශාක සංරක්ෂණ ආඥා පනතෙහි ලයිස්තු යාවත් කාලීන කරලීම පිළිබඳව සාකච්ඡා පවත්වාගෙන යනු ලැබේ.

× එංගලන්තයේ රෙකිට් ඇන්ඩ් කෝල්මන් වෙතින් ලැබුණු ඉල්ලීමක් අනුව , ශාක සහ ඒවායේ ඇතුලත් විය හැකි ඖෂධීය ගුණාංග පිළිබඳ වාර්තා වක් නරේසා ආයතනය මගින් සම්පාදනය කරන ලදී.

× පහත සඳහන් කරුණු පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- වන ජීවී දෙපාර්තමේන්තුව පුළුපු අමාත්‍යාංශයක් යටතට පත් කිරීම.
- නාය යෑම වැළැක්වීම සඳහා ගතයුතු පියවර සහ මෙම කරුණ පිළිබඳව මහජනයා දැනුවත් කිරීම.

× පාරිසරික අධ්‍යාපන වැඩ සටහන

කොරල්පර පිළිබඳ අධ්‍යාපනික සහ ප්‍රචාරක පෝස්ටර මුද්‍රණය කරන ලදී. කොරල් පර සුරැකීමේ වැදගත්කම පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් " සංරක්ෂණය සඳහා පා තගමු" සංවිධානය හා ඒකාබද්ධව මෙය සිදු කරන ලදී.

6.0 ජාතික වශයෙන් වැදගත් වාර්තා, ප්‍රකාශන සහ වැඩසටහන්

× නිතිපතා පළවන ප්‍රකාශන

- ජාතික විද්‍යා සභා සඟරාව - වෙළුම 22 (1) සහ 22(2) ප්‍රකාශයට පත් කරන ලදී. තවද ජෛව තාක්ෂණය පිළිබඳ පර්යේෂණ සහ පුහුණු අවශ්‍යතා යන මැයෙන් පැවති වැඩ මුළුවක වාර්තාව ඇතුලත් අතිරේක කලාපයක්ද පළකරණ ලදී. (වෙළුම 22 "අ" අතිරේකය)

- විද්‍යාව වෙළුම 15(2) (3 සහ 4) වෙළුම 16 (1 සහ 2, 3 සහ 4) සිංහලෙන් ප්‍රකාශයට පත් කරන ලදී. වෙළුම 16 (1 සහ 2, 3 සහ 4) ඉංග්‍රීසියෙන් පළකරන ලදී.

- තරණිය පුවත් ලිපිය - 1994 මාර්තු , ජුනි , සැප්තැම්බර් සහ දෙසැම්බර් කලාප පළ කරන ලදී.

- ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව - වෙළුම 16 (අංක 1 සහ 2) ප්‍රකාශයට පත් කරන ලදී.

× <u>වෙනත් ප්‍රකාශන</u>

- කැස්බෑවන් පිළිබඳ ප්‍රකාශන නාමාවලිය.
- ශ්‍රී ලංකාවේ කාණ්ඩීය බහුවාර්ෂික ශාක පිළිබඳ පරිපූර්ණ ලැයිස්තුව (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරන ලදී)

- වෛද්‍ය වෘත්තියෙහි ආචාර ධර්ම පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ නිර්දේශ වාර්තාව ඇතුලත් කර වාර්තාව සංස්කරණය කරන ලදී.

- ශ්‍රී ලංකාවේ වගුරු මී ගවයා පිළිබඳ ප්‍රකාශන නාමාවලිය.

- ශ්‍රී ලංකාවේ ඛනිජ පිළිබඳ අනුක්‍රමණිකාව

බොහෝ දෙනාට ලබා ගත නොහැකි වියහැකි වුත්, කාලයාගේ ඇවෑමෙන් ලේඛන හෙතින වශයෙන් පරිහානියට පත්වීමෙන් සදහටම අහිමි විය ,හැකිමුත් , අගනා දත්ත සංරක්ෂණය කර ගැනීම සඳහා, ස්වාභාවික සම්පත් පිළිබඳ කමිටුව විසින් , ඛනිජ පිළිබඳ අනුක්‍රමණිකාව සකස් කරන ලදී. හානියට පත් වාර්තා, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව අළුත් වැඩියාකර , දත්ත එක්රැස්කර , ප්‍රකාශනය සඳහා මිනුම් දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂවරයෙක් වූ එල්.කේ. සෙනෙවිරත්න මහතා විසින් ප්‍රකාශනය සඳහා සම්පාදනය කරන ලදී.

× ප්‍රදර්ශනයනට සහභාගි වීම

- විද්‍යා සහ තාක්ෂණික අමාත්‍යාංශය මගින් මාර්තු මාසයේදී අනුරාධපුරයේ සංවිධානය කරන ලද විද්‍යා හා තාක්ෂණික ප්‍රදර්ශනය

- විද්‍යා හා තාක්‍ෂණ අමාත්‍යාංශය විසින් මාර්තු /අප්‍රේල්/ මාසවලදී මීගිත්තලේ සංවිධානය කරන ලද විද්‍යා හා තාක්‍ෂණික ප්‍රදර්ශනය.

- විද්‍යා හා තාක්‍ෂණ අමාත්‍යාංශය විසින් ජුනි මාසයේදී කඩුගන්නාවේ සංවිධානය කරන ලද විද්‍යා හා තාක්‍ෂණික ප්‍රදර්ශනය

- දෙසැම්බර් මස ශ්‍රී ලංකා ජාතික විද්‍යාභිවර්ධන සංගමය විසින් කොළඹ විශ්ව විද්‍යාලයේදී සංවිධානය කරන ලද විද්‍යා තාක්‍ෂණික ප්‍රදර්ශනය.

- දෙසැම්බර් මස ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ 20 වන සංවත්සරය වෙනුවෙන් ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේදී පැවැත්වුණු ප්‍රදර්ශනය

7.0 විද්‍යාත්මක තොරතුරු පිළිබඳ කටයුතු

x සිඩීඑස්/අයිඑස්අයිඑස් මෘදුකාංග

තරේසා ආයතනය මෙම මෘදුකාංග කට්ටලය ජාතික වශයෙන් බෙදා හරින්නන් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී. 1994 වර්ෂය තුල මෙම කට්ටලය ආයතන 15 ක් වෙත බෙදා හරින ලදී. දැනට මෙය ආයතන 135 කට ලැබී ඇත. මෙම කට්ටලය භාවිතය ආයතන 15 කට නොමිලේ ප්‍රදර්ශනය කරන ලද අතර ආයතන 4 ක් වෙනුවෙන් විශේෂ 3 දින පුහුණු පාඨමාලා සංවිධානය කරන ලදී. විද්‍යා හා තාක්‍ෂණික තොරතුරු පිළිබඳ මෙහෙයුම් කමිටුවේ උපදෙස් පරිදි [illegible] අත්පොතෙහි සරළ කළ සංස්කරණ දෙකක් 1994 සැප්තැම්බර් මාසයේ ප්‍රකාශයට පත්කරන ලදී.

විද්‍යා හා තාක්‍ෂණ සමීක්‍ෂණය

ඉහත සඳහන් සමීක්‍ෂණය සඳහා දත්ත එක්රැස් කිරීමට සහ දත්ත විශ්ලේෂණයට විද්‍යාත්මක සහ පුස්තකාල කාර්ය මණ්ඩලය සහාය විය. මෙහිදී ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්‍ෂණික ආයතන සහ, විශ්ව විද්‍යාල දෙපාර්තමේන්තුද හඳුනා ගන්නා ලදී. මෙම දත්ත පදනමෙහි ඇතුලත් වූ විෂය කරුණු 598 ක් අනුක්‍රමණිකා ගත කරන ලදී.

× විද්‍යා උපකරණ අනුක්‍රමණිකාව

විද්‍යා උපකරණ අනුක්‍රමණිකාව භාවිතය දිරිගන්වන ලදී. මෙම අනුක්‍රමණිකාව භාවිතය පිළිබඳව පුහුණුව ලබා දුන් අය අතර, විවිධ විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයින් සහ කථිකාචාර්ය වරුද වූහ.

× සහයෝගිතා වැඩ සටහන්, තොරතුරු පද්ධති.

තරේසා පුස්තකාලය පහත සඳහන් තොරතුරු පද්ධති වලට සහභාගී විය. කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය (AGRINET) පාරිසරික පුස්තකාල තොරතුරු පද්ධතිය (ENLINET) සෞඛ්‍ය අධ්‍යාපනය හා පුස්තකාල තොරතුරු පද්ධතිය (HELIS) ජාතික පුස්තකාල ඒකාබද්ධ සූචිය. මෙම පද්ධතීන් සහ සහයෝගිතා සටහන් මගින් සංවිධානය කරන ලද තිතිපතා රැස්වීම් හැරුණුකොට පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ වලටද, පුස්තකාල කාර්ය මණ්ඩලය සහභාගී විය.

× ප්‍රකාශන එකතුව.

- පොත් පත්‍රිකා සහ වාර්තා 250 ක් පමණ අළුතින් එක් කරන ලදී.
- වාර සඟරා 70 ක් පමණද පුවත් ලිපි 125 ක් පමණද ලැබිණ. මේවායින් වැඩි සංඛ්‍යාව තොමිළයේ හෝ තරේසා වාරසඟරාවලට හුවමාරු කර ගැනීමේ පදනමකින් ලැබුණි.
- පුස්තකාලයේ ඇති වාරසඟරා සහ පුවත් ලිපිවල ලයිස්තු , තිබෙන නවතම ප්‍රකාශන පෙන්නුම් කෙරෙන පරිදි සකස් කර විද්‍යා හා තාක්ෂණික තොරතුරුමෙහෙයුම් කමිටුවේ සාමාජිකයින් වෙත බෙදා හරින ලදී.

× දත්ත පදනම්

- පහත සඳහන් දත්ත පදනම් පවත්වාගෙන යන ලදී.

තරේසා ප්‍රකාශන එකතුව		- සටහන් 1650
විද්‍යා සාර සංග්‍රහ		- සටහන් 283
CDS/ISIS	භාවිතකරුවන්	- සටහන් 135

- ශ්‍රී ලංකා විද්‍යා සූචිය සහ වාර සඟරා සඳහා නව දත්ත පදනම් බිහි කරන ලදී.

8.0 ජාත්‍යන්තර විද්‍යාත්මක කටයුතු

× ස්වීඩන පර්යේෂණ සහයෝගිතා නියෝජිතායතනය (සරෙක්) - කරගෙන යනු ලබන කටයුතු

- **මී ගව පර්යේෂණ වැඩ සටහන**

අතුරු ව්‍යාපෘති කිහිපයක ප්‍රමාදයන් පැවතියද මී ගව පර්යේෂණ වැඩ සටහනෙහි පර්යේෂණ කටයුතු පිළිබඳ අවසන් අදියර , සතුටුදායක ප්‍රගමනයක් පෙන්විය. 1994 වර්ෂය තුල අතුරු ව්‍යාපෘති 10 ක් නිම කරන ලදි.
තඹුත්තේගම තිවු මීගව ගොවිපළ පද්ධති පිළිබඳ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. තිවු ගොවිපළ ක්‍රමය පිළිබඳව ගොවීන් 9 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදි. ගොවි ඒකක නියාමනය කර ගෙන යන ලදි.
1994 ජුලි මාසයේ බ්‍රසීලයේදි පවත්වන ලද මීගවයින් පිළිබඳ IV වන ලෝක සමුළුවට පර්යේෂණ විද්‍යාඥයින් හතර දෙනෙක් සහභාගි වුහ.

- වෙරළබඩ පරිසරය පිළිබඳ වැඩ සටහන

වෙරළබඩ පරිසරය පිළිබඳ ව්‍යාපෘති හතර සතුටුදායක ප්‍රගතියක් පෙන්විය.

- ජාත්‍යන්තර සම්බන්ධතා අරමුදල

ජාත්‍යන්තර සම්මේලන වලට සහභාගිවීම සඳහා විද්‍යාඥයින්ට විදේශීය ගමන් ආධාර 36 ක් ප්‍රදානය කරන ලදි.

- හදිසි අමතර කොටස් අරමුදල

හදිසි අමතර කොටස් සඳහා වූ ඉල්ලීම් නවයක් අනුමත කරන ලදි.

× සරෙක් (නව වැඩ සටහන්)

සරෙක් සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර ද්විපාක්ෂික සහයෝගිතාව පිළිබඳ නව ගිවිසුමක් 1994 සැප්තැම්බර් මාසයේදි අත්සන් කරන ලදි. නරේසා ආයතනය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ව්‍යාපෘති අටක් සඳහා මෙම ගිවිසුම යටතේ ආධාර සැපයේ. මෙම නව වැඩ සටහන යටතේ කටයුතු 1994 වර්ෂයේ දෙවන භාගයේදි ආරම්භ කෙරිණ. නරේසා ආයතනය, නියාමක සම්බන්ධීකරණ ස්ථානයක් වශයෙන් යොදා ගනිමින් ඉලෙක් ට්‍රොනික් තැපැල් (E-Mail) මාර්ගයෙන් විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු හුවමාරුව සඳහා ජාතික තොරතුරු පද්ධතියක් පිහිටුවීමට නරේසා ආයතනයට ප්‍රදානයක් ලැබිණ. මේ සඳහා උපකරණ මිළදී ගැනීම පිණිස මිළ ගණන් කැඳවන ලදි. CD-ROM දත්ත පදනමට අදාලව තොරතුරු එක්රැස් කරන ලදි.

× පොදුරාජ්‍ය මණ්ඩලීය විද්‍යා සභාව.
විදේශීය සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා නාම යෝජනා එකොළහක් ඉදිරිපත් කරන ලදී.

× තුන්වන ලෝකයේ විද්‍යා ඇකඩමිය (TWAS)
ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව පිළිබඳ
TWAS/NARESA ත්‍යාග පිළිබඳව විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන වලට දැනුම් දෙන ලදී. එහෙත් 1994 වර්ෂයේදී තෝරා ගැනීම සඳහා සුදුසු අයදුම්කරුවන් නොසිටියහ.

× ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභා සංගමය (AA SSREC)
නරේසා ආයතනය , ඉහත කී සංගමයේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය වශයෙන් තවදුරටත් කටයුතු කළ අතර, කෝපන් හේගන්හි පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධන සමුළුවට සූදානම් වීම සඳහා පිලිපීනයේ පවත්වන ලද AA SSREC සංගමයේ විශේෂ කලාපීය සමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

9.0 වැදගත් පර්යේෂණ නිගමන

× <u>බේත්තියන් (Baytex 50 EC) ඉසීමෙන් නාගරික ප්‍රදේශවල මදුරු ගහණය කෙරෙහි ඇති වූ බලපෑම</u>

ශ්‍රී ලංකාවේ බැංක්‍රොෆ්ටියන් ෆිලේරියාසිස්(Bancroftian Filarasis) වාහක Culex quinguetasciatus මදුරුවාගේ බහුලව බෝවන ස්ථානයක් වන සනීපාරක්ෂක වළවල් වල මදුරු ගහනයන් කෙරෙහි , ෆෙන්තියන් (Baytex 50 EC) ඉසීමෙන් ඇති වූ බලපෑම.

ඉසීමේ චක්‍රයන් තුළ සනීපාරක්ෂක වළවල් වල ජලයෙහි ෆෙන්තියන් සාන්ද්‍රණයද හා සමඟ නිර්ණය කරන ලදී.

ඉසීමේ චක්‍රයේ අවසන් දිනය හැරුණු කොට සෙසු දිනයන්හි , ෆෙන්තියන් සහිත වළවල්වල දක්නට ලැබුණු මුළු ජීවන අවස්ථා සංඛ්‍යාව ෆෙන්තියන් රහිත වළවල්වල එම සංඛ්‍යාවට වඩා සැළකිය යුතු තරම් අඩු විය. ෆෙන්තියන් ඉසින ලද වළවල්වල ජීවන අවස්ථා සංඛ්‍යා , කීට , අතුරු රූ සහ පිලවී සංඛ්‍යා ෆෙන්තියන් නොඉසින ලද වළවල් වලට වඩා

බොහෝ සේ අඩු විය. ජේත්තියන් ඉසීමෙන් , වළවල්වලින් නිකුත් වන පුහුඹුල් වාහක සංඛ්‍යාව අඩුවන බැවී මෙයින් පෙනී යයි.

ජේත්තියන් නොඉසින ලද වළවල් හා සසඳා බලන විට ජේත්තියන් ඉසින ලද වළවල් සම්බන්ධයෙන් ඉසීමෙන් අනතුරුව දින වල කීට සහ පිලවී ගහණයේ ඝනත්වය සහ ඉසීමෙන් අනතුරුව දින ගණන අතර මනා සෘණ සම්බන්ධතාවක් පෙන්නුම් කෙරිණ. ඉසින ලද දිනය සහ ඉසීමෙන් පසුව 6 වන දිනය අතර ජේත්තියන් සාන්ද්‍රතාව (Baytex 50 EC) දළ වශයෙන් 1000 ගුණයකින් පහත වැටිණ.

<u>Culex quinquefasciatus</u> වාහකයින්ගේ

කීටයන් මෙන්ම පුහුඹුලන්ද, Femephos සහ පර්මෙත්‍රින් හැරුණුකොට සෙසු සියළුම කෘමි නාශකයන්ට ප්‍රතිරෝධිතාව දැක්වූහ. (පර්යේෂණ ආධාර ප්‍රදාන අංක ආර්පී/91/බී/02 - ආචාර්ය එම්.ටී. ආර්. පීරිස්).

× ශ්‍රී ලංකාවේ හොජ්කින්ස් නොවන ලිම්ෆෝමාව පිළිබඳ ප්‍රතිශක්ති පටක රසායනික අධ්‍යයනය

මෙය කොළඹ වෛද්‍ය පීඨයේ ව්‍යාධිවේද අංශයේදී අතීතයට බලපාන පරිදි කරන ලද අධ්‍යයනයකි.

1983 සිට 1991 දක්වා ලැබුණු ව්‍යාවාහි ගණ්ඨි ජෛවේක්ෂා පරීක්ෂා කරන ලදී. සියළුම ප්‍රාථමික රිෂ්ධ, ද්විතීය නිධි සහ හොජකින් ලිම්ෆෝමාවන් මෙම අධ්‍යයනයෙන් බැහැරකරන ලදී.

හොජ්කින්ස් නොවන සියළුම ලිම්ෆෝමාවන් සාමාන්‍ය පටකවේදිය ක්‍රම අනුව පරීක්ෂා කරන ලදී. හැරලීන් කුට්ටිවලින් නව ජේදයන් සකසා ඇවිඩින් බයටින් සංකීර්ණ ක්‍රමයට ප්‍රතිශක්ති වේදිය වර්ණගැන්වීම් කරන ලදී. B සහ T සෛල හඳුනා ගැනීමට භාවිතා කරන ලද්දේ පිළිවෙලින් L 26 සහ $UCHL_1$ යන සළකුණය. රෝගියාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ව්‍යාවාහි ගණ්ඨිය ජෛවේක්ෂාව ලබාගත් ස්ථානද සටහන් කරන ලදී.

අධ්‍යයනයට භාජනය කෙරුණු හොජ්කින්ස් නොවන ලිම්ෆෝමාවන් 38 න් වැඩි සංඛ්‍යාව (47% ක්) ග්‍රෛවීය වසා ග්‍රන්ථි ව්‍යාපය (Cervical lymphoadenopathy) පෙන්විය. මෙම රෝගීන් කිසිවකුටත් චර්මීය ලිම්ෆෝමාව නොතිබිණ. පිරිමි රෝගීන් 22 දෙනෙක්ද, ගැහැණු රෝගීන් 10 දෙනෙක්ද වූ අතර, හොජ්කින්ස් නොවන ලිම්ෆෝමාව පැවති රෝගීන්ගේ මධ්‍යන්‍ය වයස අවුරුදු 48 ක් විය. පටකවේදීය වශයෙන් වැඩි සංඛ්‍යාව (60%) අන්තර්මධ්‍ය ප්‍රමාණයට මෑත්සරිකතාවයෙන් යුක්ත විය. ප්‍රතිශක්ති වේදීය වශයෙන්, හොජ්කින්ස් නොවන ලිම්ෆෝමාවන් 38 ක් අතුරින් 31 ක් B සෛල ලිම්ෆෝමාවන්ද, 6 ක් T සෛල ලිම්ෆෝමාවන්ද විය. එක් ලිම්ෆෝමාවක් වර්ගීකරණය නොකෙරිණ. හොජ්කින්ස් නොවන ලිම්ෆෝමාවන්ගේ 12% ක් T සෛලයන්ගේන් මූලාරම්භය වන බව මෙම අධ්‍යයනයෙන් නිගමනය කරන ලදි.
(ප්‍රදාන අංක ආර්පී/ 91/එම්/06 - වෛද්‍ය පී. අභූනාවල)

× <u>තේ වල ෆ්ලෝරයිඩ් ජෛව උපයෝගිතාව</u>

තේවල ෆ්ලෝරයිඩ් (F) ජෛවීය ප්‍රයෝජ්‍යතාව, NaF වල ජෛවීය ප්‍රයෝජ්‍යතාව ආශ්‍රයෙන් අගයනලදි. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ වයස අවුරුදු 23 - 26 අතර සෞඛ්‍ය සම්පන්න පිරිමින් දහඅටදෙනෙකුට, ෆ්ලුඔරයිඩ් හීන ප්‍රමිත කළ ආහාරය දෙන ලදි. ඔවුනට වත්කළ තේ වශයෙන් හෝ NaF වශයෙන් F මිලිග්‍රෑම් 1 මාත්‍ර වශයෙන් මුඛයෙන් දෙන ලදි. පාළක දින වල ඔවුනට ආසුත ජලය සමාන පරිමාව බැගින්ද ලැබිණ. සෑම පුද්ගලයෙක්ම දින තුනේ කාල පරිච්ඡේද තුනකට තමන්ම පාළකයන් විය.

ෆ්ලෝරයිඩ් මාත්‍රා දීමට පැයකට පෙර සහ පසුව, ප්ලාස්ම සහ මුඛ හෝ බෙට F මට්ටම් සන්සෝදනය කිරීමෙන් සැළකිය යුතු වෙනස්කම් දක්නට ලැබිණ. NaF දීමෙන් පසු ලැබුණු ප්ලාස්ම පැතිකඩ සහ බෙට මට්ටම් තේ වල එම මට්ටම සම විය. මූත්‍ර විශ්ලේෂණ යෙන්ද, F සාන්ද්‍රණයේ වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය පැය 7 ක් දක්වා කාලයක් තවත්වාගනු ලැබිණ. පැය 24 ක් තුල NaF වශයෙන් දෙන ලද F 75% පිට කරන ලද අතර තේ ශරීරගත වීමෙන් පසුව පිටවූයේ F 60% ක් පමණි. තේ ශරීරගත වීමෙන් පසු තේ වල ෆ්ලෝරයිඩ් NaF වලට සමාන මට්ටම්වලින් ශරීර තරල වල

පැතිරෙන බැව් නිගමනය කරමු. මෙය සංවර්ධනය වන රටවල ෆ්ලෝරයිඩ් අඩු ප්‍රදේශයන්හි දරුවන් තුල, දන්ත පිරණය වැළැක්වීම සඳහා ආහාරයට අතිරේකයක් වශයෙන් තේ භාවිතය යොදා ගැනීම ප්‍රයෝජනවත් යන මතය සනාථ කරන ප්‍රතිඵලයකි. එහෙත් තේ බහුලව පානය කරන, ෆ්ලෝරයිඩ් මධ්‍යස්ථ ප්‍රමාණයක් සහිත ප්‍රදේශවල , ළමයින් තුල තේ වලින් ෆ්ලෝරයිඩ් හටගැනීමටද ඉඩ ඇත. (ප්‍රදාන අංක ආර්පී/89 /එම්/03 - මහාචාර්ය පී.ඒ.ජේ. පෙරේරා සහ මහාචාර්ය කේ.ඒ.එස්. වර්ණකුලසූරිය).

× <u>ශ්‍රී ලංකාවේ ගවයින් , බැටළුවන් සහ එළුවන් පිළිබඳ රක්තවේදිය අධ්‍යයන</u>

රුධිරයෙහි සෛලීය සංරචකයන් පිරික්සීම සත්ව රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා වැදගත්ම පර්යේෂණාගාර පරීක්ෂණ ක්‍රියාවලින් අතුරින් එකකි. එහෙත් ශ්‍රී ලංකාවේ සායනික රක්තවේදිය දත්ත අනුවර්තනය කිරීම සහ රෝග විනිශ්චයට ආධාරක වශයෙන් යොදා ගැනීම බොහෝ හීලෑ සතුන්ට විශේෂයෙන්ම අදාලව ආශ්‍රේය අගයන් (reference values) නොමැති වීම නිසා බෙහෙවින් සීමා වී ඇත. මෙම අධ්‍යයනය මගින් ලංකා බෝයර් එළුවන්, බැටළුවන් සහ ඇතැම් ගව විශේෂයන්ගේ රෝගී සත්වයින්ට අදාල දත්ත අනුවර්තනය කිරීම සඳහා පාදරේඛා අගයන් වශයෙන් යොදා ගත හැකි සාමාන්‍ය රුධිර අගයන් නිගමනය කර ඇත.

කොටුකච්චියේ එළු අභිජනන මධ්‍යස්ථානයේ පාලනය කරනු ලබන සායනික වශයෙන් සෞඛ්‍ය සම්පන්න වූත් විවිධ වයස්වල (මාස 1-3 , මාස 4 - 12, වර්ෂ 2 - 3 , වර්ෂ 4 - 8) පසුවන්නාවූත් ලංකා බෝයර් එළුවන් 121 දෙනෙක් (ගැහැණු සතුන් 53, පිරිමි සතුන් 86) පිළිබඳව රක්තවේදිය විශ්ලේෂණ පවත්වන ලදී. වෙනත් වයස් කාණ්ඩවලට අයත් සතුන්ට වඩා නව්‍ය සූති (Neonatal) සතුන්ගේ, ඇහුරු සෛල පරිමාව, රතු රුධිරාණු හිමෝග්ලොබින් සංඛ්‍යාව . මධ්‍යනය දේහාණු පරිමාව සහ මධ්‍යන්‍ය දේහාණු හිමෝග්ලෝබින් වෙනත් වයස් කාණ්ඩවල සතුන් හා සැසඳු කල අධික විය. අනෙක් අතට මධ්‍යන්‍ය දේහාණු සාන්ද්‍රණය නියතව පැවති අතර වයස අනුව ඇති වූ වෙනස් කම් දක්නට නොලැබිණ. මාස 0 - 3 අතර වසු පැටවුන් තුල වසා සෛල සහ උදාසීනකමින් සංඛ්‍යාව බොහෝ දුරට එක හා සමාන විය.

මාස 4 ත් 12 ත් අතර සතුන්ගේ සහ අවුරුදු 4 – 8 අතර පිරිමි සතුන්ගේ උදාසීනකාමී සංඛ්‍යාව වසා සෛලසංඛ්‍යාවට වඩා බෙහෙවින් වැඩි විය. වැඩිම ඉසනොෆිල සංඛ්‍යාවක් වූයේ මාස 4 වසර 3 අතර වයසැති සතුන් තුලය. මෙම විශේෂය සඳහා වාර්තාගත වී ඇති, වයස් හා සම්බන්ධ රක්තවේදිය වෙනස්කම් මෙම අධ්‍යයනයෙහි ප්‍රතිඵලවලින් පිළිබිඹු විය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් පාලනය කරනු ලබන බිංගිරිය ගොවි පළෙහි සායනික වශයෙන් සෞඛ්‍ය සම්පන්න බැටළු දෙනුන් (වසර 2-4) 41 ක් පිළිබඳව බැටළු රක්තවේදිය අධ්‍යයනය පවත්වන ලදි. නිරපේක්ෂක අගයන්හි වෙනස්කම් තිබුනද, මෙම පරීක්ෂයන්ගෙන් ලැබුණු අගයන්, වාර්තා වී ඇති අගයන්ට සමාන්තර විය. පුර්ලූ පරාසයක් ඔස්සේ පැතිරි එරිත්‍රොසයිට සංඛ්‍යාවල මධ්‍යන්‍යය 12×10 /l විය. හිමෝග්ලෝබින් අන්තර් ගතය සහ ඇසුරුනු සෛල පරිමාව විචල්‍ය වුවද ඒවායේ සාමාන්‍ය ව්‍යාප්තියක් දක්නට ලැබිණ. පැයක් තුල ඇති වූ එරිත්‍රොසයිට අවසාදනය ඉතා අල්පය. සුදු රුධිරාණු තත්ත්වයද කලින් වාර්තා වී තිබූ තත්ත්වයට සමාන විය. එනම් උදාසීනකමින් අභිබවා වසා සයිට පැවතිණ. ඉසනොෆිලද ඉහළ මට්ටමක පැවතිණ. අධ්‍යයනයට භාජනය කළ සතුන් නිතිපතා ප්‍රතිහෙල්මින්ත ගල්වනු ලැබ සිටියද ශාරීරික වශයෙන් පරීක්ෂා කිරීමේදී සායනිකව සෞඛ්‍ය සම්පන්න සේ පෙනුනද, ඔවුන් තුල කිසියම් පරපෝෂිතතාවක් වූ බව මෙයින් පෙන්නුම් කෙරිණ.

සත්ත්ව ගොවිපළවල් තුනක පාලනය කරනු ලබන වර්ග තුනකට අයත් දෙනුන් 238 ක් (ෆ්‍රීසියන් 94 , අයර්ෂයර් 115 සහ යුරෝපා දෙමුහුන් සතුන් 28 ක්) පිළිබඳව ගව රක්තවේදී අධ්‍යයන පවත්වන ලදී. ෆ්‍රීසියන් සහ අයිෂයර් වර්ගවල ,මාස 06 මාස 6 – 12 , වසර 1–3 සහ වසර 3 – 8 යන වයස් කාණ්ඩවලට අයත් සත්ව කාණ්ඩ 04 ක් පිළිබඳව වයස් ආශ්‍රිතව ඇති වන රක්තවේදිය වෙනස්කම් අධ්‍යයනයට භාජනය කරන ලදි. අධ්‍යයනය කළ සියළුම යුරෝපීය දෙමුහුන් සතුන් කිරණ තත්ත්වයේ පසු වූ අතර ඔවුන්ගේ වයස් අවුරුදු 3 – 7 ත් අතර විය. වැඩිම එරිත්‍රොසයිට සංඛ්‍යාව වූයේ මාස 0 – 6 අතර වයසැති සතුන්ගේය. වයස වැඩිවන්ම එරිත්‍රොසයිට් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු විය.

හිමොග්ලොබින් සාන්ද්‍රණයේද , ඇසිරුණු සෛල පරිමාවෙහිද එබඳු වෙනස්කම් දක්නට ලැබුණද, විචල්‍යතාවත් එතරම් පැහැදිලිව නොපෙනුණි. කිරි එරුණු යුරෝපීය දෙමුහුන් දෙනුන්ගේ මධ්‍යනය දේහාණු හමොග්ලොබින් සාන්ද්‍රණය සෙසු වර්ග අතින් වාර්තා වූ ප්‍රමාණයන් හා සැසඳීමේදී සැළකිය යුතු විචල්‍යතාවක් පෙන්විය. සියළුම වර්ගයනට අදාලව ලැබුණු සුදු රුධිරාණු සංඛ්‍යාව, මෙම විශේෂයට අදාලව වාර්තා වී තිබූ පරාසය ඇතුලත විය. විවික්ත ගිණුම් වලදී වසා සෛල උදාසීනකමින් අභිබවා පැවති අතර, වයස වැඩිවීමත් සමග ඉයොසිනොෆිල් ප්‍රමාණය වැඩි විය. (පර්යේෂණ ප්‍රදාන අංක ආර්පී/87/ වී/05 - ආචාර්ය එන්. යූ. හොරදාගොඩ).

× <u>මිය යාමෙන් පසුව ගතව ඇති කාලය තීර්ණය කිරීම සඳහා අයකරණ වෛද්‍ය</u>

<u>සාධක වශයෙන්</u>

<u>සාකොසාප්‍රොෆජිගස කෘමීන් භාවිතය</u>

දේහක ඩිප්ටෙරා අනුප්‍රාප්තියෙහි ආක්‍රමණික රටාව අධ්‍යයනය කිරීම සහ, දේහයක දක්නට ලැබෙන විවිධ මැසි විශේෂයන්ගේ කොමේරු අවස්ථාවන්හි වයස තක්සේරු කිරීම මිය යෑමෙන් පසුව ගතව ඇති කාලය තක්සේරු කිරීම , සඳහා වැදගත්වන කෘමි විද්‍යාත්මක ක්‍රමයක් වෙයි.

1991 - 1993 දක්වා කාලය තුල මාසිකව ඩිප්ටෙරාන් අනුප්‍රාප්තිය පිළිබඳව කුණප අධ්‍යයන 17 බැගින් කොළඹදී පවත්වන ලදී. ඊට අමතරව පහතරට ප්‍රදේශ තුනක (අනුරාධපුර, හම්බන්තොට සහ කතරගම) පරීක්ෂණ 05 ක්ද, මැද රට ප්‍රදේශ දෙකක (රත්නපුර සහ මහනුවර) පරීක්ෂණ 04 ක් ද කඳුකර ප්‍රදේශ දෙකක (හැටන් සහ නුවරඑළිය) පරීක්ෂණ 03 ක් ද මේ කාලය තුල පවත්වන ලදී.
තිරුවර්ණය වූ කුණපයන්හි ඩිප්ටෙරා අනුප්‍රාප්තිය රටෙහි විවිධ පළාත්වලින් ලබා ගත් මිනිස් කුණපයන්ගෙන් ලබා ගත් බිත්තර /කීට / පිලවි නිදර්ශක 36 ක් භාවිතයෙන් අධ්‍යයනය කරන ලදී.

උෂ්ණකාලයන් තුනකින් ලබා ගත් සාවුන්ගේ කුණපයන්හි වූ කෘමි විශේෂයන්ගේ සංරචකය පහත දක්වන පරිදි විය.

උන්නතාංශ මට්ටම	විශේෂයන්ගේ සංරචකය
පහත රට	Calliphora vicina, Chrysomyia megacephala Chrysomyia rufifacies, Sarcophaga sp. Ophyra sp, Muscian sp (not found in corpses)
මැද රට	Calliphora vician, Chrysomyia megacephala, Chrysomyia rufifacies, Chrysomyia pinguis, Sarcophaga sp, Ophyra sp.
කඳු රට	Calliphora vicina, Chrysomyia megacephala Chrysomyia pinguis, Sarcophaga sp, Ophyra sp Muscina sp (not found in corpses)

සාවුන්ගේ කුණප මත, මුලින්ම බිත්තර / කීට / පිලවී හටගැනීමට ගත වූ මධ්‍යන්‍ය කාලය, යහපත් කාලගුණයක් පවතින විට පැය 22.5 ක් විය. අනුප්‍රාප්තිය පටන් ගැනීමට පෙර මධ්‍යම ප්‍රමාණයට සහ අධිකව වැසි පැවති විට, පිළිවෙලින් පැය 28.3 ක් සහ 43.41 ක් වාර්තා විය. වෙනත් පහත රට ප්‍රදේශවල වාර්තා වූ කාලය පැය 19.7 කි. රත්නපුර, නුවර, හැටන් සහ නුවර එළිය යන ස්ථානවල පිළිවෙලින් පැය 12.4, පැය 20 සහ පැය 45 යන කාලයන් වාර්තා විය.

Muscina විශේෂය හැරුණු කොට මේ හා සමාන මැසි සංරචකයක් දේහයන්ගෙන් වාර්තා විය. විවිධ රැල් මුලින්ම බිහිවීමට ගත වූ කාලය, සාවුන්ගේ කුණපයන්ගෙන් වාර්තා වූ කාලයට සමාන විය.

Calliphora vicina, Chrysomyia megacephala, Chrysomyia rufifacies විශේෂයන්ගේ බිත්තර/ කීට/ පිලවී වල වයස යටතේ තක්සේරු කරන ලදී. Chrysomyia megaephala, Chrysomyia rufifacies, Chrysomyia pinguis වල සාර්ලභතාව, ජීව්‍යතාව, සහ විභවතාව විවිධ පෝෂණ තත්ත්වයනට අදාලව මනින ලදී.

මැසි විශේෂයන්ගේ සංරචකයෙහි දක්නට ඇති වෙනස්කම්, අපරාධ සෙවීමේදි, මෘත දේහයක් තිබී ඇති ප්‍රදේශය සොයා ගැනීමට ආධාරක වෙයි.

විවිධ විශේෂයන්ගේ කොමේරු අවස්ථාවල වයස, මිය යාමෙන් පසු ගතව ඇති කාලය නිර්ණය කිරීම සඳහා යොදා ගත හැකිය. (පර්යේෂණ ආධාර අංක ආර්පී/91/එම්/01 – ආචාර්ය ආර්. ප්‍රනාන්දු, මහචාර්ය එන්. කෝදාගොඩ'.

Leucinodes orbonalis සහ Rhynchophorus ferrugineous සඳහා ස්වාභාවික ආකර්ශක කෛතුයේදී භාවිතය පිළිබඳ පරීක්ෂණ.

බටු දළුව සහ ගෙඩිය විදින Leucinodes orbonalis Guenee (Lepidoptera: pyralidae) ගේ ස්ත්‍රී ලිංග ෆේරෝමෝනය වන (E) - 11 - hexadecenyl acetate කෙරෙහි, ලිංග ෆේරෝමෝන ග්‍රන්ථිහි සුළු සංරචකය වන E - 11 - hexadecenol වල බලපෑම, තක්සේරු කරන ලදී. කෛතු කටයුතු සඳහා Y නළ ආඝ්‍රාණ මාපක රසායනාගාර මරණ පරීක්ෂණයකින් 9:1 (v/v) අනුපාතයට E7 -11 - හෙක්සඩෙසනෝල් සහ E -11-HDA සම්මිශ්‍රණයක් තෝරා ගන්නා ලදී. ඉහත සඳහන් ෆේරොමෝන මිශ්‍රණයෙන් කරන ලද කෛතු කටයුතු වලින් මධ්‍යනය රාත්‍රියකට උගුලකට පිරිමි සතුන් 3.0 කට වැඩි වූ සතුන් ප්‍රමාණයක් හසුවිය. ඉහත සඳහන් ෆේරෝමෝන් සම්මිශ්‍රණය භාවිතයෙන් කරන ලද කෛතු කටයුතු සන්සන්දනාත්මකව බලන කල (E) -11- HDA වලින් හසු වූයේ රාත්‍රියකට, උගුලකට පිරිමි සතුන් 1.8 ක මධ්‍යනය ප්‍රමාණයක් පමණි. එහෙත් මෙම තත්ත්වයන් යටතේම ඇම වශයෙන් සප්‍රාණික , කන්‍යා ගැහැණු සතුන් තුන්දෙනෙක් යෙදීමෙන් පිරිමි L. orbonalis සතුන් වැඩි සංඛ්‍යාවක් (උගුලකට මධ්‍යනය ප්‍රමාණය, රාත්‍රියකට / උගුලකට / පිරිමි සතුන් / 3.55 ක්) හසු විය.

ශ්‍රී ලංකාවේ පොල් ගසට වැළඳෙන ප්‍රධාන පලිබෝධකයකු වන රතු කුරුමිණියන් පාළනය / මර්දනය සඳහා , ඇම වශයෙන් ආකර්ශකයක් යෙදූ උගුලක් තැනීම පිණිස විභව ආකර්ශක කිහිපයක් පරීක්ෂා කරන ලදී. පරීක්ෂණ සඳහා රතු කුරුමිණියා සඳහා ප්‍රබල EAG උත්තේජක දෙකක් වන, Pentanol සහ n-propanol වාෂ්ප ආශ්‍රිත පොල් පොත්තෙන් හඳුනාගත් ආකර්ශක දෙකක් වන 4-hydroxy-3-methoxystyrene (s) සහ nonanic lactone (L) ,(EAG උත්තේජ) සහ methyl-5-nonanol (ferrugineol) Rhynchophorus ferrugieus ගේ ෆේරෝමෝන සමාහරණයේ වඩාත් ක්‍රියාශීලි සංරචක තෝරා ගන්නා ලදී. Y නළ අර්ධකනමාපක ද්විවරණ පරීක්ෂණය භාවිතයෙන් කළ පර්යේෂණාගාර අධ්‍යනයකදී කෂිම (s) සහ (L) 1:1 (v/v) අනුපාතයට සම්මිශ්‍රණය කිරීමෙන් ug 30 - 750 පරාසයේ (s) හෝ (L) මාත්‍රාවන් තනිකර දීමට වැඩි ප්‍රතිචාරයක් කුරුමිණියන්ගෙන් ලැබිණ. (උදා: ug 125 මාත්‍රාවක ඇමකට කුරුමිණියන් 80% කට එරෙහිව 50.00% සහ 55 . 6% ක් ආකර්ශණය වූහ).

ඉහත සඳහන් විභව ආකර්ෂකයන්ගේ එනම් පෙන්ටනොල්, ප්‍රොපැනොල්, සම්මිශ්‍රිත S සහ L (1 : 1 , v/v) සහ ජෙරැනියොල් පිළිබඳ ක්‍රියාකාරීත්ව සත්සන්දනයකදි, කෙටි දාම මද්‍යසාර දෙක වන පෙන්ටනොල් හා ප්‍රොපනොල් වලට රතු කුරුමිණියන්ගෙන් අධික ප්‍රතිචාරයක් ලැබිණ. (ඇම වශයෙන් දෙවර්ගය යොදාගත් විට පිළිවෙලින් රතු කුරුමිණියන් 79% ක් සහ 80% ක් ආකර්ෂනයන්) ලබා ගනිමින් කෙටි පරාස ආකර්ෂක ගුණාංග පෙන්නුම් කෙරිණ. සත්සන්දනාත්මකව බලන කල ඒකාබද්ධ සහ (1:1) සහ ජෙරැනියොල් සඳහා පිළිවෙලින් එය (62% සහ 69%) විය.

ඉහත සඳහන් ආකර්ෂක පිළිබඳ ක්ෂේත්‍ර අර්සනයකදි ජෙරැනියෝල් සහ S සහ L 1:1 (v/v) සම්මිශ්‍රණය මගින් පමණක් රතු කුරුමිණියන් සබන් වතුර සහිත බාල්දි ක්‍රමයේ උගුලකට හසුවිය.(දිනකට උගුලකට හසු වූ කුරුමිණියන් මධ්‍යනය ප්‍රමාණය පිළිවෙලින් 0.23 සහ 0.013 n = 6 විය). ඉහත දී හඳුනා ගන්නා ලද කෙටි පරාස ආකර්ෂකවල පෙන්ටනොල් සහ ප්‍රොපනොල් හා ඒකාබද්ධව ක්ෂේත්‍ර ආකර්ෂකයන් වශයෙන් ජෙරැනිනොල් වල විභවතාව තවදුරටත් අර්සණය කරන ලදී. ජෙරැනිනොල් සහ පෙන්ටනොල් සම්මිශ්‍රණය (1.1 v/v) මගින් දිනකට / උගුලකට / කුරුමිණියන් 0.40 වැඩි ප්‍රමාණයක් (= 6) හසු විය. මෙම මිශ්‍රණය දින 60 ක්ට වැඩි කාලයක් ක්ෂේත්‍රයේදි සක්‍රිය විය.

මෙසේ ජෙරැනියොල් සහ පෙන්ටනොල් (1:1, v/v) මිශ්‍රණය , ශ්‍රී ලංකාවේ වැඩුණු රතු කුරුමිණි ගහණය මර්දනය / පාළණය සඳහා පිරිමැසුම්දායි (ඇම සහිත උගුලකට පිරිවැය දළ වශයෙන් රු. 30/= වන) පාරිසරික වශයෙන් යහපත් වූ , දිගුකල් පවතින ඇමක් වෙයි.(පර්යේෂණ ආධාර අංක ආර්පී/සී/02 - ආචාර්ය එන්.ඊ . ගුණවර්ධන).

<u>Ebanaceae කුළයට අයත් ඇතැම් ශාක පිළිබඳ රසායනික පරීක්ෂණය</u>

Ebanaceae කුළයට අයත් ඇතැ ම් ශාකවල ඇති රසායනික සංරචකය ඒකායනය සහ හඳුනාගැනීම පිළිබඳව මෙම පර්යේෂණයෙන් වාර්තාවේ. පර්යේෂණ වැඩ සටහනෙහිදී ඩයස්පයිරොස් විශේෂ හතක්, එනම් <u>D.Ferrea, D. insignis, insignis var. insignis parvifolia,</u> විශේෂය <u>D.Malberica, D. Montana, D. racemosa</u> සහ D. Walkeri රසායනකව අධ්‍යයනය කර, දුපෙන් කාණ්ඩයට අයත් සංයෝග, නැප්තක්විනෝන්) කුමරින් සහ සයිටෝස්ටෙරොල්, යන සංයෝග , වෙන් කර ගන්නා ලදී. මෙම සංයෝගයන් අතුරින් , විරළවූ කුමරින් සහ

උම්කලින් ඒකායතය කර ගැනීම, ඩයොස්පයිරොස් විශේෂයන්ගෙන් ලෙෂු ඔක්සජනිකෘත කුමරින් ප්‍රථම වාර්තාව වෙයි. පර්යේෂණ ආධාර අංක ආර්පී/ 90/සී/04 - ආචාර්ය පී. එම්. කේ. බී. ගුණසේරත්).

× විදුලිධාරා වොල්ටීයතා (I v) සහ ධාරණ වෝල්ටීයතා (සී වී) ක්‍රම භාවිතයෙන් අර්ධ සන්නායක විෂම ජාතිය සන්ධිවල විදුලි බල ලක්ෂණීකරණය

× අණුක කදම්බ එපිටැක්සි ලෝහ කාබනික රසායනික වාෂ්ප අවසාදනය යනාදී දියුණු ද්‍රව්‍ය සැකසීමේ ක්‍රම ප්‍රවර්ධනය වත්ම, ඉකුත් දශකය හෝ දශක දෙක තුළ, අර්ධසන්නායක භෞතවේදය පිළිබඳ පර්යේෂණ විශාල ප්‍රගතියක් ලබා ඇත. මෙම නව ද්‍රව්‍ය අතුරින් අර්ධ සන්නායක විෂමඃ ජාතිය ව්‍යුහයන්ට වැදගත් තැනක් හිමි වන්නේ , අර්ධසන්නායක ලේසර්, ක්වන්තම ළිං අධෝරක්ත අනාවරක අනුනාදක උමං ඩයෝඩ යනාදි ප්‍රායෝගික යෙදවුම් සඳහා ඒවායේ ඇති විභවතාව නිසාය.

විෂමජාතියව්‍යුහයන් රාශිය අතුරින් ප්‍රායෝගික යෙදවුම් සඳහා , GaAs/AlGaAs වල ඇති විභව විද්‍යුත් ගුණාංග නිසා එය විද්‍යාඥයින්ගේ වැඩිම අවධානය ලබා ගෙන ඇත. විෂමව්‍යුහ පදනම්කරගත් ඉලෙක්ට්‍රොනික් සහ දෘෂ්‍ය මෙවලම් සැකසීමේදී විෂමජාතිය සන්ධිවල ඇති තීරු හිඩැස් බණ්ඩනා ව සහ අතුරු මුහුණත් ආරෝපණ ඝනත්වය වැදගත් පරාමිතින් දෙකක් වෙයි.

GaAs/AlGaAs පද්ධතිය ඇතුළු විෂම ජාතිය සන්ධීන්හි සන්ධි පරාමිතින් නිර්ණය කිරීම සඳහා විවිධ ප්‍රකාශ සහ විදුලි ශිල්ප ක්‍රම යොදා ගෙන ඇත. එහෙත් විවිධ ශිල්ප ක්‍රම වලින් ලබා ගත් තීරු අනුලම්බ අගයන්හි, සැළකිය යුතු වෙනස්කම් ඇත. අපගේ අරමුණ වූයේ GaAs/AlGaAs විෂම සන්ධි ආරෝපණ ව්‍යාප්තියෙහි සන්ධි පරාමිතින් සහ GaAs/$Al_x Ga_{1-x}As$ (x=0.3) විෂම සන්ධිවල සන්නායක තීරු අනුලම්බය අධ්‍යයනය කිරීම සඳහා අණුක කදම්බ විදුලි වෝල්ටීයතා (I-V) සහ ධාරණ වෝල්ටීයතා ක්‍රම ඒකබද්ධව යොදා ගැනීමයි.

අණුක කදම්බ එපිටැක්සි මඟින් සෑදුණු n-N විෂම සන්ධි පිළිබඳව I-V සහ C-V මැණීම් කරන ලදී. වාහක සාන්ද්‍රණය 10^{17} සෙ.මී.-3 පරාසයේ විය. සන්නායක තීරු අනුලම්බ E සහ අතුරු මුහුණත් ආරෝපණ ඝණත්වය පිළිවෙලින් මෙග වොට් 250 meV සහ 2×10^{c10} cm^{-2} විය. මිනුම්වලින් විෂමජාතිය සන්ධියේ අධික තීරු හිඩැස් අගයේ විසරණ විභවතාව

meV 217 ක් බැව් පෙණින.

(පර්යේෂණ ප්‍රදාන අංක ආර්පී/90/පී/ 02 ආචාර්ය කේ. ප්‍රේමරත්න) .

× සම්බාධක මිණුම් භාවිතයෙන් අර්ධසන්නායක වල පැතලි තීරු විභවතාවය සහ ප්‍රකාශ උත්ප්‍රේරක ක්‍රියා කාරීත්වයට ඒවායේ ඇති සහ සම්බන්ධතාව නිර්ණය කිරීම සහ පොලි ඇනයිලින් තුනී පටල පිළිබඳ විද්‍යුත් රසායනික අධ්‍යයන .

මෙම ව්‍යාපෘතිය යටතේ දෙආකාරයක පරීක්ෂණ පවත්වා ඇත. ඉන් පළමුවැන්නෙන් $CuInSe_2$ සහ CuCNS අර්ධ සන්නායකවල පැතලි තීරු විභවතා ව සහ වාහක සාන්ද්‍රණය මැණීම කෙරෙහි අවධානය යොමු කෙරිණ. දෙවැන්න පොල් අතු වලින් වල සංශ්ලේෂණ සහ විද්‍යුත් ලක්ෂණ කෙරෙහි යොමු විය.

$CuInSe_2$ ත්‍රියංගි සංයෝග අර්ධසන්නායකයා එහි අද්විතීය විද්‍යුත් ගුණාංග නිසා බෙහෙවින් විභව ප්‍රකාශ වෝල්ටීය ද්‍රව්‍යයක් වෙයි. කාමර උෂ්ණත්වයේදී මෙම ද්‍රව්‍යයෙහි 1.0 eV පමණ සෘජු තීරු පරතරයක් ඇත. මෙය සූර්ය බලශක්තිය කාර්යක්ෂමව පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රශස්ත අගයන්ට බෙහෙවින් සමීප වෙයි. ෆෝටෝන් ශක්ති e v 1.5 ක් වූ කල $CuInSe_2$ අවශෝෂණ සංගුණකය සෙ.මී.$^{-1}$ පමණ වේයයි වාර්තා වී ඇත. මෙය ප්‍රායෝගික වශයෙන් ප්‍රයෝජනවත් අර්ධසන්නායක සඳහා වාර්තා වී ඇති ඉහළම අගයන් අතුරින් එකකි. මෙම ද්‍රව්‍යයෙන් ඇති තවත් එක් වාසියක් වන්නේ Cu In අවකාශයන් ඇති කිරීම සඳහා සුදුසු වර්ධන තත්ත්වයන් භාවිතයෙන් ඒවා p ආකාර හෝ n ආකාර ගැන්විය හැකි වීමයි. $CuInSe_2$ හි මෙම විශේෂ විද්‍යුත් ගුණාංග නිසා තුනී පටල සූර්ය කෝෂ , ප්‍රති විද්‍යුත් රසායනික කෝෂ සහ වෙනත් බොහෝ ප්‍රායෝගික ප්‍රයෝජනයන්ට මග පෑදී ඇත. එසේ වුවද මෙම ක්‍රියා වලියේ දෘෂ්ටි විද්‍යුත් ගුණාංග පූර්ණ වශයෙන් අවබෝධ කර ගැනීම සඳහා වැඩිදුර මූලික පර්යේෂණ කළ යුතුව ඇත. අනෙක් අතට කියුප්‍රස් තයෝසයනේට් CuCNS eV 3.6 ක පමණ තීරු පරතරයක් ඇති සාම්ප්‍රදායික නොවන අර්ධ සන්නායක ද්‍රව්‍යයක් වෙයි. මෙම ද්‍රව්‍යය , සායම් සංවේදීකෘත ප්‍රකාශ පරිවර්තන පද්ධතීන්හි සාර්ථක අයුරින් භාවිත කර ඇත. මෙම පද්ධතීන්ගේ විදුලිබල ලාක්ෂණිකරණය මගින් මෙම ද්‍රව්‍යයන් පදනම් කරගත් ව්‍යුහයන් සෑදීම සඳහා අවශ්‍ය වටිනා තොරතුරු සපයා ගත හැකිය.

මෙම අධ්‍යයනයේදී අර්ධසන්නායක /විද්‍යුත් විච්ඡේදක අන්තර් මුහුණතෙහි දී තීරු පරතරය සහ වාහක සාන්ද්‍රතාව ඇස්තමේන්තු කිරීම සඳහා පැතලි තීරු විභවතාව නිර්ණය කිරීමට අපි Mott-Schottky ක්‍රමය භාවිත කරන ලදී.

බලශක්ති පරතරයන් $CuInSe_2$, සඳහා 1.12 ද, CuCNS සඳහා 3.5 ක් වශයෙන්ද ඇස්තමේන්තු කරන ලදී.

පොලි ඇනිලින්, විද්‍යුත් උපකරණ, තොරතුරු ස්මරණයන්, උත්ප්‍රේරක, බැටරි ඉලෙක්ට්‍රෝඩ යනාදි විවිධ ප්‍රායෝගික යෙදවුම් සඳහා අවශ්‍ය විදුලි සහ දෘෂ්‍ය ගුණාංග සඳහා විභවතාවක් පෙන්නුම් කරන සන්නායක බහු අවයවයක කාණ්ඩයකට අයත් වෙයි. විභව ස්ථිතික තත්ත්වයන් යටතේ විද්‍යුත් රසායනික කෝෂ භාවිතයෙන් විද්‍යුත් බහු අවයවීකරණයෙන් මෙම ද්‍රව්‍ය පහසුවෙන් පිළියෙල කරගත හැකිය. විද්‍යුත්විච්ඡේදක මාධ්‍යය ජලීය හෝ අජලීය වීමට පිළිවන.

මෙම කාර්යයේදී ඇනිලින් ජලීය මාධ්‍යයක විද්‍යුත් බහු අවයවීකරණය මගින් පොලි ඇනිලින් පටල පිළියෙල කරන ලදී. අපගේ අරමුණ වූයේ පසුකල ඉලෙක්ට්‍රෝඩ සහ විද්‍යුත් විච්ඡේදන මාධ්‍යයේ pH අගය යනාදිය අතින් විවිධ වූ සැකසුම් තත්ත්වයන් යටතේ , පොලිඇනිලින් පටලවල සැකැස්ම සහ විද්‍යුත් චර්යාව පරීක්‍ෂා කිරීමයි. විභව පියවරක යෙදවීමේදී පොලිඇනිලින් පටල වල ඇති වන අනිත්‍ය චර්යාවද අප විසින් පරීක්‍ෂා කරන ලදී.

අත්හදාබැලීම්වලදී ඇනිලයින් මි. ලි. 1.0 ක් 0.1M පසුතල විද්‍යුත් විච්ඡේදක මි. ලි. .50 ක් ද්‍රාවනය කරන ලදී. තෝරාගත් පසුතල විද්‍යුත් විච්ඡේදක වූයේ $NaClO_4$ සහ Na_2SO_4 වල 0.1 M ද්‍රාවනයන්ය. පරීක්‍ෂණ තුලින් ලබා ගත් වෝල්ට් ඇමෝග්‍රම් අනුව පොලිඇනිලින් පටලවල සන්නායකතාව පසුතල ඉලෙක්ට්‍රෝඩයන්ගේ ස්වාභාවිය මත ප්‍රබල ලෙස රඳා පවත්නා බව පෙන්නුම් කෙරිණ. සන්නායකතාව , විද්‍යුත්විච්ඡේදක ද්‍රාවනයේ pH අගය මත බොහෝ දුරට රඳාපවත්නා බවද පෙනී ගියේය. pH අගය 3 ත් ඉහළ යන සේ වැඩි කළවිට සන්නායකතාව නොවැදගත් අගයන් දක්වා අඩු විය. විභව විද්‍යුත් වර්ණක චර්යාවන් යෙදවීමත් සමග පටලයේ වර්ණ වෙනස්වන බවද නිරීක්‍ෂණය කරන ලදී. විභව අදියරක යෙදවීමෙන් කාලය (T) සමග ධාරාවේ පරිහානිය t^{-n} බල නියමයක් අනුගමනය කරන බවත් n අගයන් 0.4 සිට 1.0 දක්වා පරාසයක වන බවත් අනියත මිණුම් වලින් පෙනී ගියේය. එහෙත් ප්‍රශස්ථ කොට්‍රල් තත්ත්වයන් පැවති විට n = 0.5 ක බල නියමයක් පෙන්නුම් කෙරිණ. මෙම අපගමනය කිසියම් විභව පියවරකදී විසරණ සීමිත ධාරා වලට අමතරව ආරම්භ නොවන ධාරා පැවතීම නිසා වූවක් විය හැකිය. (පර්යේෂණ ප්‍රදාන අංක ආර්පී/91 /පී/02 - මහාචාර්ය එච්.ඒ.කේ.එල්. දිසානායක , ආචාර්ය කේ. ප්‍රේමරත්න).

× ආයතනික නව්‍යතාවක් පිළිබඳ ඇගයීමක් ශ්‍රී ලංකාවේ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනගහණය වෙනුවෙන් ක්‍රියාත්මක කරණ ලද (1981) ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කෙරිණ. ද්විතීය දත්ත රැස්කිරීම , ගවේෂණාත්මක අධ්‍යයන සහ ලේඛන අධ්‍යයන මේ සඳහා යොදාගත් ක්‍රමෝපායයන් විය. මෙයින් ලැබෙන ප්‍රතිලාභ එහි සාමාජිකත්වය ලබන වයස මත රඳා පවතින බවත් , වැඩි වයසකදී මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබන්නවුන් වැඩි ප්‍රතිලාභ ලබන බවත් පෙනී ගියේය. මෙය ශුභසාධක වැඩ සටහනකට වඩා ජීවිත රක්ෂණ ක්‍රමයකට සමාන වෙයි. කාලයත් සමග ගෙවීම් තීව්‍රතාව අඩුවන බවත්, සාමාජිකයින් රඳවා ගැනීම් ශක්තිය අඩු බවත් පෙනී යයි. මෙහි ප්‍රතිලාභ , විශ්‍රාම වැටුපක් මෙන් බෙදී යන නමුදු එය සාමාන්‍යයෙන් රක්ෂණ ක්‍රමයක් සේ සැළකිය හැකිය. මෙම අධ්‍යයනයෙන් එළඹී නිගමන , යෝජනා ක්‍රමයෙහි පිරිවැය සහ ප්‍රතිලාභ සකසා ගැනීම සඳහා යොදා ගත හැකිය.

යෝජනා ක්‍රමය පිළිබඳව ඉදිරිපත් කර ඇති විස්තරයෙන් එහි ප්‍රතිලාභ රජයේ සේවකයන්ට ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභය හා සමාන කර දැක්වීමට ප්‍රයත්නයක් දරා ඇත. එහෙත් ඇත්තෙන්ම මෙය කෘෂිකාර්මික සාමාජයක ගොවීන් ලබා අනිවාර්ය ඉතිරිකරවීමක් කරවීම සඳහා දියත් කරණ ලද , ජීවිත රක්ෂණ ක්‍රමයක් සේ සැළකිය හැකිය. විශ්‍රාම වැටුපක් යනු රජය හෝ වෙනත් සේවාලාභියකු විසින් සේවකයා විසින් අතීතයේදී ඉටු කරන ලද සේවය සළකා කඩින් කඩ පිරිනමන ගෙවීමකි. FPSSB යෝජනා ක්‍රමය යටතේ අර්ධවාර්ෂිකව ලැබෙන ආදායම ගොවියා විසින් යෝජනා ක්‍රමයෙහි සාමාජිකත්වය ලැබූ දින පටන් කරන ලද ආයෝජනය (පිරිවැය) මගින් ජනිත වන ආදායම සේ සැළකිය හැකිය. එහෙයින් එය ජීවිත රක්ෂණ ක්‍රමයකට වඩාත් සමීපය. එසේ වුවද, එමගින් ග්‍රාමීය ඉතිරිකිරීම් දිරිගන්වන බැවින් , එයින් කෘෂි කාර්මික සංවර්ධනයට වැදගත් මෙහෙවරක් ඉටු කෙරෙයි.

වැඩි හිටි ගොවීනට තරුණ ගොවීන්ට වැඩි ප්‍රතිලාභයක් අත්වන බවද අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරෙයි. ඇත්තෙන්ම මතුපිටින් බලන කල තරුණ ගොවීන්ට අත්වන ප්‍රතිලාභ ඉතා ප්‍රයෝජනවත්ය. එහෙත්, ආර්ථික දර්ශක යොමු කර ඇත්තේ වැඩි වයස් වලදී මෙයට බැඳෙන ගොවීන්ට ප්‍රයෝජනවත් වන සේය. වයස අවුරුදු 20 , 30 , 40, 50 සහ 55 කාණ්ඩවලට අයත් ගොවීහු පිළිවෙලින් 12% , 20%, 14%, 15%, සහ 18%, වශයෙන් ප්‍රතිලාභ ලබති. සාමාජිකයින් රඳවා ගැනීමේ ශක්තියද එතරම් සතුටුදායක නැත. කාලයත් සමග , ගෙවීම තීව්‍රතාවයෙහි පිරිහීමක් දක්නට ලැබෙයි. එක් අතකින් යෝජනා ක්‍රමයට

බැඳුණු මුළු ගණන ඉහල ගොස් ඇති නමුදු, ඉන් ඉවත් වූ සංඛ්‍යාවද ඉහළ ගොස් ඇත. එහෙයින් මෙහි ප්‍රගතිය ඇගයීමේදි මෙකී සාධක දෙකම සැළකිල්ලට ගත යුතුය. ප්‍රාදේශීය මට්ටමෙන් ගොවීන් මෙම යෝජනා ක්‍රමයට සහභාගිවීම සාධක ගණනාවක් මගින් සීමා වී ඇත. (පර්යේෂණ ප්‍රදාන අංක ආර්ජී/92/එස්එස්/10 - ආචාර්ය එම්. විජේරත්න) .

× සිලිකන් කාබයිඩ් කෙඳිවලින් වැරගැන්වූ ලිතියම් ඇලුමිනොසිලිකේට් (LAS) සහ කැල්සියම් ඇලුමිනෝසිලිකේට් (CAS) වීදුරු සෙරමික් සංයුක්තිහි ඇදියාම් විරූපණය.

සිලිකන් කාබයිඩ් (SiC) කෙඳිවලින් වැරගැන්වූ ලිතියම් ඇලුමිනෝ සිලිකේට් (LAS) විදුරු පිඟන් මැටි සහ SiC කෙඳි වලින් වැර ගැන්වූ කැල්සියම් ඇලුමිනෝසිලිකේට් (CAS) විදුරු , සෙරමික් සහ SiC කෙඳිවලින් වැරගැන්වූ කැල්සියම් ඇලුමිනෝසිලිකේට් (CAS) විදුරු සෙරමික් අධික උෂ්ණත්වයේදි දක්වන ඇදි යාමේ විරූපණය, ප්‍රත්‍යාබලයන් සහ උෂ්ණත්වයන් පුළුල් පරාසයක් තුළ පරීක්ෂණයට භාජනය කරන ලදි.

LAS විදුරු සෙරමික් සංයුක්තිය ඒකාක්ෂිකව වැරගැන්වා ඇති අතර CAS විදුරු සෙරමික් සංයුක්තය ද්වි අක්ෂිකව වැරගැන්වා ඇත.

අඟල හතරකින් සමන්විත නැවීමේ ඇදියාම් පරීක්ෂණ පැවැත්වීම සඳහා , අපගේ පරීක්ෂණාගාරයේදි ඇදීමේ යන්ත්‍රයක් සැළසුම් කර ඉදි කරන ලදි. සෙ. 950 - 1200 පරාසයේ සාදක වායු පරිසරයක් සහ 70 - 250 MPa ප්‍රත්‍යාබල පරාසයක් යටතේ , පරීක්ෂණ පවත්වන ලදි. SiC කෙඳිවල ඇදි යාමේ ප්‍රතිරෝධතාව LAS න්‍යාසයට වඩා අධික බැව් පෙනී ගියේය. අඛණ්ඩ SiC කෙඳිවලින් වැරගැන්වීමෙන් , LAS විදුරු සෙරමික්වල ඇදි යාමේ ප්‍රතිරෝධකතාව ඉහළගොස් ඇති බව පැහැදිලිව පෙනී ගියේය. ඇදියාම් ප්‍රමාණය උෂ්ණත්වය (T) වෙනස් කරමින් ප්‍රත්‍යාබලයට ස්ථාවරව තබා ගැනීමෙන්ද, ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය මගින්ද මනින ලදි. පිළිවෙලින් In e Vs ln O සහ ln e Vs 1/T සැළසුම් කිරීමෙන් , ඇදීමේ විරූපණ සඳහා n ප්‍රත්‍යාබල සාතය සහ Q සක්‍රිය කරන බලශක්තිය ලබා ගන්නා ලදි.

SiC/LAS සහ SiC/CAS උෂ්ණත්වය විචලන පරීක්ෂණවලින් ගණනය කරන ලද සක්‍රිය කරන බලශක්තීන් පිළිවෙලින් 140 සහ 200 $KJ\ mol^{-1}$ විය. කෙසේ වුවද මෙම ද්‍රව්‍යවල සක්‍රිය කරණ ශක්තීන් වැඩිදුර තාප පිරියම්න් පසුව සැළකිය යුතු අන්දමින් වැඩි වූ බැව් නිරීක්ෂණය කරන ලදි.

LAS සහ CAS සංයුක්තින් දෙකෙහිම තාප පිරියමට ලක් කළ ආදර්ශකවල ප්‍රත්‍යාබල විචලන පරීක්ෂණ වලින් ගණන් බැලූ ප්‍රත්‍යාබල ඝාතක අගයන් එකකට ආසන්න විය. මෙම සංයුක්ත ද්‍රව්‍යවල ඇදියාම් විරූපණයන්ට හේතු වන්නේ විසරණ ආධාරක කර ගන්නා යන්ත්‍රණයක් බැව් මෙයින් පෙන්නුම් කෙරේ. ලැබුණු තත්ත්වයේ සහ තාප පිරියම් කළ නිදර්ශක වල සක්‍රිය කරණ ශක්තියේ වෙනස් කම් බොහෝ දුරට ඇති වන්නේ කෙඳි සහ න්‍යාස ද්‍රව්‍ය අතර තාප පිරියමෙහිදී අතුරු පැති කඩෙහි ඇති වෙනස් කම් නිසා විය හැකිය.

ලැබුණු වෘෂ නිදර්ශක පිළිබඳ පරිලෝකන ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂණ පැවැත්මෙන් කෙඳි පරිමා ප්‍රතිශතය 30% ක පමණ වූ බැව් පෙනී ගියේය. කෙන්ද්‍රක සාමාන්‍ය අර්ධ විෂ්කම්භය µm 10 ක් පමණ වන අතර වීදුරු සෙරමික්වල කණිකා ප්‍රමාණය බෙහෙවින් කුඩා හෝ (µm 1 ට අඩු) ය. එසේ වුවද විරූපණ යන්ත්‍රණය මැනවින් අවබෝධ කර ගැනීමට නම්, විරූපිත ආදර්ශකය අධික විභේදන සම්ප්‍රේෂණ ඉලෙක්ට්‍රෝන අන්වේෂණය (TEM) ට භාජනය කළ යුතුය.

SiC/LAS ක්‍රියාවලියේ කෙඳි සහ න්‍යාසය අතර, පැහැදිලි අතුරු මුහුණත් කලාප දෙකක් පෙන්නුම් කර ඇත. කෙඳිවලට යාබද කලාපය, ඉලෙක්ට්‍රෝන බලශක්ති හානි අන්වීක්ෂණය (EELS) මගින් අස්ඵටික කාබන් වශයෙන් තහවුරු කරගන්නා ලදී. ඊළඟ ස්ථරය, මි. මී. 100 පමණ කුඩා කණිකා 20 කින් පමණ සමන්විත විය. මෙම ස්ථරය EELS ක්‍රමයට සහ බලශක්ති අපකිරණීය එක්ස්කිරණ විශ්ලේෂණ (EDAX) ක්‍රමයට විශ්ලේෂණ කිරීමේන්, කණිකා මූලික වශයෙන්ම Nbc වන බැව් පෙන්නුම් කර ඇත. LAS වීදුරු සෙරමික්වල සූක්ෂම ව්‍යුහයට අමතරව ස්ඵටිකරණ චර්යාවද , විද්‍යුත් සන්නායකතා මිමි භාවිතයෙන් අනියම් ලෙස අධ්‍යයනය කරන ලදී. මෙම මැනීම් කරන ලද්දේ සෙ. 200° - 750° උෂ්ණත්ව පරාසයකදීය. ප්‍රතිරෝධකතාවෙහි හදිසි විචලනයක් , සෙ. 625° දී පමණ දක්නට ලැබිණ. මෙම උෂ්ණත්වය , ද්‍රව්‍යයේ වීදුරු සංක්‍රාන්ති උෂ්ණත්වය වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම ද්‍රව්‍යය වීදුරුවල සිට වීදුරු සෙරමික් බවට සංක්‍රමණය වීමේදී සක්‍රිය කරණ බලශක්ති යේ eV 0.6 සිට 1.03 දක්වා වැඩි වීමක් පෙන්නුම් කෙරිණ. මේ ආශ්‍රිතව සන්නායකතාවයේ ඇතිවන පිරිහීම, වීදුරු ස්ඵටිකරණය වන බවට සළකුණකි.

සංයුක්ත ආදර්ශක තාප පිරියමට භාජනය කිරීමේදී න්‍යාසයෙන් එන සිලිකා/ [illegible] ශකෘදි / න්‍යායය අතරු මුහුණතෙහි කාබන් ස්ථරයේ ඝනතය ගනියි. එහෙයින් අතුරු මුහුණතෙහි ලිස්සුම් ප්‍රතිරෝධකතාව වැඩිවෙයි. ඒ නිසා අධික ලිස්සුම් ඝර්ෂණය හේතුකොටගෙන, සංයුක්ත ද්‍රව්‍යයට බොහෝ දුරට ඒකාශ්මික සෙරමික් වර්ගයක් හා සමානව හැසිරිය හැකිය. කෙසේ වුවද, විසරණ ක්‍රියාවලිය , සංයුක්තියේ අවම වේගයකින් විසරණය වන විශේෂය මගින් පාලනය වනු ඇත. මීට අමතරව තාප පිරියම මගින් කණිකා වර්ධනයට සහ අවශිෂ්ඨ වීදුරු වැනි අදියර ස්ඵටිකරණය වීමටද හේතු විය හැකිය. ලැබුණු වහා නිදර්ශක සහ තාප පිරියමට ලක් කළ නිදර්ශක අතර සක්‍රියකරණ ශක්තියෙහි වෙනස , සංයුක්තීන්හි මෙම සූක්ෂම ව්‍යුහාත්මක වෙනස්කම් නිසා සිදු වීමට බොහෝ දුරට ඉඩ ඇත. LAS සහ CAS වීදුරු සෙරමික් වලට කෙඳි අන්තර්ග්‍රහණය කිරීමෙන් ඇදීම් ප්‍රතිරෝධතාවෙහි සැළකිය යුතු දියුණුවක් ඇති විය හැකිය. මෙම සෙරමික් සංයුක්ත ද්‍රව්‍යයන්හි අධික උෂ්ණත්ව ඇදීම් ක්‍රියාවලියේදී බොහෝ දුරට ඇතිවිය හැකි විරූපණ ක්‍රියාවලිය විසරණය ආශ්‍රිත යන්ත්‍රණයකි.

× ශ්‍රී ලංකා වේ වෙරළබඩ ධීවර කර්මාන්තය සඳහා අලෙවි ආයතන(වෙරළබඩ ධීවර කර්මාන්තයේ තොග සහ සිල්ලර අලෙවිය : මාතර, ගාල්ල, කළුතර සහ මහනුවර දිස්ත්‍රික්ක ආශ්‍රයෙන්)

1980 මැද භාගයේ මත්ස්‍ය නිෂ්පාදනය පිරිහීම සිදු වූයේ ප්‍රධාන වශයෙන්ම සිවිල් අරගල සහ රටෙහි උතුරු නැගෙනහිර ප්‍රදේශවල ආරක්ෂක තත්ත්වය හේතුකොටගෙනය. සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය , ඉල්ලුමට වඩා අඩු වන අතර , අවශ්‍ය ඉතිරි ප්‍රමාණය වෙනත් රටවලින් ආනයනය කරනු ලැබේ. නැගෙනහිර වෙරළේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිද ඇතුළු ධීවර සංවර්ධන සැළැස්ම මගින් 1990 - 1994 අතර ගෙදර දොර මත්ස්‍ය පරිභෝජනය 9% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය 25% කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කළ යුතු වෙයි. මෙම අධ්‍යයනයෙහි පොදු අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය වෙළඳ පොළෙහි අපූර්ණතාව අගයා , ධීවරයින්ගේ ආදායම කෙරෙහි එම අපූර්ණතා මගින් ඇති වන බලපෑම් මැනීමයි.

වෙරළබඩ ධීවර නිෂ්පාදන වලින් 95% පමණ නිෂ්පාදනය ගබඩා කිරීම, ප්‍රමාණය සහ පාරිභෝගිකයන්ට බෙදා හැරීම කරනු ලබන්නේ පුද්ගලික අංශ මගිනි. මත්ස්‍ය අලෙවි කරණයේදී මසුන් එක්රැස්කිරීම, තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම යන සියළු අංශවල සැළකිය යුතු ප්‍රමාණයක ඒකාධිකාරයක් හෝ කතිපයාධිකාරයක් පවතියි. එහෙයින් අපූර්ණ ලෙස තරඟකාරීද, වන පුද්ගලික අංශයේ ධීවර කටයුතු වලින් තොග වෙළෙන්දාට සහ සිල්ලර වෙළෙන්දාට අධික ලාභ ාංශ ලැබෙයි. මෙහි ප්‍රතිඵලය වශයෙන් වෙරළබඩ නිෂ්පාදකයනට අඩු මිළක්ද, පාරිභෝගිකයන්ට වැඩි මිළක්ද අත්වෙයි. අධ්‍යයනයේ ප්‍රතිඵලය අනුව, පහත සඳහන් ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ධීවර සංස්ථාව, ප්‍රමාණවත් කාර්ය මණ්ඩයක්, ප්‍රමාණවත් මිළදී ගැනීමේ ස්ථාන සංඛ්‍යාවක්, මසුන් මිළදී ගැනීම සඳහා ධීවර සමුපකාර සමිති සමග ප්‍රමාණවත් සම්බන්ධතා මිළදී ගන්නා ස්ථානවල මසුන් නරක් වීම අඩු කිරීම සහ ප්‍රධාන තොග හා සිල්ලර වෙළඳ පොළ වල මසුන් ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් (ශීතාගාර වැනි) යනාදිය සහිතව වඩා මැනවින් සංවිධානය විය යුතුය. එය ප්‍රමාණයත්, ප්‍රාග්ධනයකින් යුක්තව ධීවර අංශය සඳහා තරඟකාරී වෙළඳපළක් ඇති වන පරිදි සංවර්ධනය විය යුතුය. මිළ කාර්යක්‍ෂමතාව ඇති වීම පිණිස, ධීවර අංශය සඳහා වඩාත් යහපත් අලෙවිකරණ තොරතුරු පද්ධතියක් රටෙහි වර්ධනය කළ යුතුය.

වෙරළබඩ දිස්ත්‍රික්කවල ධීවර සමුපකාර සමිති, ප්‍රමාණවත් ප්‍රාග්ධනය, කාර්ය මණ්ඩලය, ගබඩා පහසුකම්, ශීත කාමර, අයිස් සැපයීම් සහ ප්‍රවාහන පහසුකම් සහිතව, කාර්යක්‍ෂම වූ පුද්ගලික අංශයට මහා තරඟයක් එල්ල කළ හැකි පරිදි සකස් විය යුතුය. ධීවර සංස්ථාවට ඔබ-වෙරළක හා ගැඹුරු මුහුදෙහි ධීවර කටයුතුවල නියැළී, අස්වැන්න කුඩා තොග සහ සිල්ලර වෙළඳුන් වෙත සාධාරණ මිළගණන් වලට යොමු කළ හැකිය.

මාළු හිඟ කාලයට පාරිභෝගික ඉල්ලුම සපුරාලීමටත්, මසුන් අධික කාලවල සිල්ලර මිළ පහත වැටීම වැළැක්වීමටත්, අධික නිෂ්පාදනය ඇතිකාලයන්හිදී, කරවල නිෂ්පාදනය දිරි ගැන්වීම අවශ්‍ය විය හැකිය. තොග වෙළඳ පොළට වඩා තරඟකාරී කරලීම සඳහා විශේෂයෙන්ම මසුන් නිෂ්පාදනය නොකරන ප්‍රදේශවල තොග වෙළඳ කටයුතු වලට ඇති බාධක ප්‍රමාණය(උදා: ප්‍රවාහන මිළදී ගැනීමේ ගබඩා කිරීමේ පහසුකම් අහිමි) ඉවත් කිරීම අවශ්‍ය වෙයි. ප්‍රවාහනයේදී මසුන් නරක් වීම නිසා තොග වෙළඳාමේදීත් සිල්ලර වෙළඳාමේදීත් තබා ගන්නා ලාභාංශ අධික වෙයි. මත්ස්‍ය නිෂ්පාදන ප්‍රදේශවල සිට

මසුන් ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් අයිස් සැපයුම, ප්‍රශස්ත ප්‍රමාණයන් ප්‍රවාහනය, ප්‍රවාහන ක්‍රමය , වඩා හොඳ මාර්ග සහ වෙරළබඩ නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා වෙත යාමේදී ගත වන කාලය අවම කරලීම යනාදියට අදාලව සුදුසු තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමෙන් මෙම පිරිවැය අඩු කළ හැකිය. තොග සහ සිල්ලර මධ්‍යම වෙළඳ පොළවල පාරිභෝගිකයිනටද ප්‍රමාණවත් පහසුකම් සැළසිය යුතුය.

ධීවර අංශයේ සාධක විශ්ලේෂණය සඳහා අවශ්‍ය අතීත දත්ත ප්‍රමාණවත් නොවේ. ධීවර අංශය පිළිබඳව අඛන්ඩ වූත් සුපරියප්තවූත් දත්ත පදනමක් පවත්වාගෙන යාමට නම්, වෙරළබඩ දිස්ත්‍රික්ක පිළිබඳ ජන විකාශ විද්‍යාත්මක ලක්ෂණ ඉඩම් උපයෝජන රටා ධීවර සමූපකාර පිළිබඳ විස්තර, වෙරළබඩ ප්‍රදේශවල අල්ලන් මාළු සහ කරවල නිෂ්පාදන දත්ත, වෙරළබඩ නිෂ්පාදකයින්ගේ මිල, වෙරළබඩ දිස්ත්‍රික්කවල සහ පිට පළාත්වල තොග මිල සහ සිල්ලර මිල, දිස්ත්‍රික්කවල අළුත් මාළු පරිභෝජනය, ආනයනය සහ අපනයනය ආනයනය සහ අපනයන මිළ පිළිබඳ දත්ත අවශ්‍ය වනු ඇත.

× ලිස්ටීරියා ආහාර ඒකලිතයන් ගේ ප්‍රචණ්ඩත්ව නිර්ණය කිරීම

කිරි ආහාර Listeria monocytogenes මගින් දූෂණය වීම දක්නට ලැබී ඇත. ලිස්ටීරියා මගින් මිනිසා තුළ ලිස්ටීරියෝසියාව හටගනියි. එය ගබ්සාව, මළදරු උපත්, පූතිරක්තය සහ මොළේ උණ, වැනි සායනික රෝග ලක්ෂණ පුළුල් පරාසයක් හටගන්වන ආසාදනයක් හෝ රෝගයක් වෙයි. L. monocytogenes වල ප්‍රචණ්ඩ සාධකයක් වශයෙන් හිමොලිසින් සාවනය වීම, මෙම පර්යේෂණය යටතේ අධ්‍යයනය කරනු ලැබේ. (ප්‍රදාන අංකය: ආර්පී/ 93/බීවී/01 - ආචාර්ය සී.පී. කොඩිකාර සහ මහාචාර්ය එස්. විද්‍යාපතිරණ) .

× ශ්‍රී ලංකාවේ Anopheles culicifacies සංකීර්ණය ලක්ෂණීකරණය - වාහක හැකියාව පිළිබඳ අධ්‍යයන .

A. culi මදුරුවන් (n = 1910) පිළිබඳව ගෝමැඩියාවල (n = 364) හල්මිල්ලෑව (n = 273) , ඇල්පිටිය (n = 182) පොල්ගහවෙල (n = 91) සහ අනුරාධපුරය (n = 100) යන ස්ථානවල කරන ලද ක්ෂෙත්‍ර පරීක්ෂාවන්ගෙන් A විශේෂය ඇති බවට කිසිදු සාක්ෂියක් පෙන්නුම් කර නැත. බෙහෙවින් පුනරාවර්ති DNA අනුක්‍රමිකයන් Rp36, Rp 20, Rp 234 A. culicifacies වලින් ඒකලනය කරගනු ලැබ ඇත. මදුරු ශීර්ෂ ආධාරයෙන් කරන ආරසනයන් " ඒ විශේෂය ක්ෂෙත්‍රයේන් සොයා ගැනීම සඳහා Rp 217 DNA ඒෂණය ඉතා මත් සුදුසු විය. ශ්‍රී ලංකාවේ එය තිබීමට ඉඩකඩ ඇත්ද යන්න සැක හැර දැන ගැනීම සඳහා වැඩි දුර පරීක්ෂණ පවත්වනු ඇත.

තනුක DNA නිදර්ශක සහ මදුරු ශීර්ෂ "squash-blot" භාවිතයෙන් A,B සහ C විශේෂයන්ගෙන් ආරසනයක් පවත්වන ලදී. (පර්යේෂණ ප්‍රදාන අංක ආර්පී/ 93/බී වී /02 - ආචාර්ය එච්. බී. ගුණසේකර).

× සාගර තරංග බලශක්ති පිරියතක් සඳහා පරීක්ෂණාගාර මාදිලි පිළිබඳ අධ්‍යයනයක් සහ ශ්‍රී ලංකා වේ දකුණු දිග සහ නිරිතදිග වෙරළේ සාගර තරංග බලශක්ති පිරියතක් සඳහා සුදුසු ප්‍රදේශයක් තෝරා ගැනීම පිණිස සමීක්ෂණයක්

ගාල්ලේ සිට පලටුපාන දක්වා සමීක්ෂණයක් කරන ලදී. 20 කට අධික ස්ථාන සංඛ්‍යාවකින් ස්ථාන තුනක් එනම් උණවටුන, බුන්දල සහ පලටුපාන ඒවායේ වෙරළබඩ රූපවේදය, අවසාදිත ප්‍රවාහනය සමුච්චය සහ ඛාදනය අනුව තෝරා ගනු ලැබ ඇත.
තරංග වේගය, තරංග උස, සුළං ප්‍රවේගය පිළිබඳ කරන ලද වැඩිදුර අධ්‍යයනයක් අනුව තරංග බලශක්ති පිරියත පිහිටුවීම සඳහා සුදුසුතම ස්ථානය වශයෙන් , උණවටුන තෝරා ගන්නා ලදී.

තරංග බලශක්ති පිරියත දෝලනය වන ජල කඳකින් සමන්විතය. තරංග බලශක්තිය යාන්ත්‍රිකව විදුලිබලය බවට පරිවර්තනය වීම, පරීක්ෂණාගාරයේ දෝලන ජල කඳක ආකෘතියක් භාවිතයෙන් පරීක්ෂා කෙරෙනු ඇත. විශ්ව ස්ථානයන්ගෙන් ලබා ගත් දත්ත, දෝලන ජල කඳට යෙදීමෙන් උපරිම නිපැයුම නිශ්චය කෙරෙනු ඇත. (පර්යේෂණ ආධාර අංක ආර්පී/93/ ඊපී/ 01 - ආචාර්ය ටී.කේ.ඩී. හෙත්තකෝන් සහ ඊ.එම්. එස්. විජේරත්න මහතා) .

× Aspergillus niger වලින් ඇමයිලොග්ලූකොසිඩේස් සහ සිට්‍රික් අම්ල නිෂ්පාදනය උපරිමකරණය . ඒකලනය කරලත් විවිධ ඇස්ප්‍රිලස් මාදිලි අතුරින් Aspergilus විශේෂයේ P_1 මාදිලිය සිට්‍රික් අම්ල වැඩියෙන්ම නිෂ්පාදනය කරන මාදිලි වශයෙන් හඳුනා ගන්නා ලදී. විකෘතින් භාවිතයෙන් සහ මාධ්‍යය, මෙතනොල් සහ තල තෙල් හෝ ග්ලූකෝස් භාවිතයෙන් පරිපූරණ කිරීමෙන් සිට්රික් අම්ල නිෂ්පාදනය වැඩි විය. කාබන් ආශ්‍රිත නයිට්‍රජන් මගින් දිලීර වර්ධනය වැඩි වූ අතර සිට්‍රික් අම්ලන් නිෂ්පාදනය අඩු වූ බවද, $NH_4\ NO_3$ මගින් දිලීර වර්ධනය ස්ථායිව තබා ගනිමින් සිට්‍රික් අම්ල නිෂ්පාදනය වැඩි වූ බවද පෙනී ගියේය. (පර්යේෂණ අංක ආර්පී/93/බීටී/01 - මහාචාර්ය කේ. බාලසුබ්‍රමානියම්).

1 වන සටහන: තරෙසා ආයතනයේ අනුග්‍රහයෙන් දෙන ලද පර්යේෂණ ප්‍රදාන

විෂය ක්ෂෙත්‍රය තත්ත්වය	කෘෂිකර්මය සහ සත්ව පාලනය	ජෛවීය විද්‍යා	රසායනික විද්‍යා	බලශක්තිය	තොරතුරු විද්‍යාව	වෛද්‍ය සහ පශු වෛද්‍ය විද්‍යා	භෞතික සහ ඉංජිනේරු විද්‍යා	සමාජ විද්‍යා	ජෛව විද්‍යා	විද්‍යා අධ්‍යාපන
1994 ක්‍රියාත්මකව තිබූ ප්‍රදාන සංඛ්‍යාව	06	21	14	02	-	14	16	25	07	02
1994 පිරිනැමූ ප්‍රදාන සංඛ්‍යාව	-	02	03	02	01	03	03	04	02	-
1994 සඳහා වෙන්කළ මුදල (නව සහ කරගෙන යනු ලබන) රු.	-	713,385	636,300	168,600	30,000	554,520	392,590	100,200	221,400	31,000
1994 වර්ෂයේ සම්පූර්ණ කළ ප්‍රදාන සංඛ්‍යාව	03	01	04	-	01	10	07	05	-	-
1994 අත්හිටවූ ප්‍රදාන සංඛ්‍යාව	-	-	-	-	-	-	-	02	-	-
1994 නැවැත්වූ ප්‍රදාන සංඛ්‍යාව	-	-	-	-	-	-	-	01	-	-
1994 පත්කළ පර්යේෂණ සහකරුවන් සංඛ්‍යාව	-	-	03	-	-	-	02	-	01	-
1994 පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	01	01	-
1995 නව අයදුම්පත්	08	08	10	02	-	08	09	05	08	01
1995 වර්ෂය සඳහා ඉල්ලා ඇති මුදල් රු.	2,637.885	1,471,556	584,250	168,000		927,835	1,203,780	661,780	1,138,000	20,000
1995 (මාර්තු දක්වා) අනුමත කර ඇති ප්‍රදාන සංඛ්‍යාව	-	02	06	-	-	03	01	-	-	-

2 වන සටහන : විදේශීය නියෝජිතායතනවල අනුග්‍රහයෙන් දෙන ලද ප්‍රදාන 1994 දී තත්ත්වය පිළිබඳ සාරාංශය

විදේශීය නියෝජිතායතනය/ විෂය ක්ෂේත්‍රය තත්ත්වය	සරෙක්-මීගව පර්යේෂණ වැඩ සටහන	සරෙක්- වෙරළබඩ පරිසරය පිළිබඳ පර්යේෂණ වැඩ සටහන.	සරෙක්-පුනර්ජීවනයවන බලශක්තීන් හා බලශක්ති කාර්යක්ෂමතාව	අයියුසිඑන්/ නෝරාඩ් x කඩොලාන	විදේශීය සංවර්ධන පරිපාලන-ශ්‍රී ලංකාවේ ශාක සංග්‍රහ ව්‍යාපෘතිය
1994 වර්ෂයේදී ක්‍රියාත්මකව තිබූ මුළු ප්‍රදාන සංඛ්‍යාව	40	06	02	02	01
1994 වර්ෂයේ පිරිනැමූ ප්‍රදාන	01	01	02	-	-
1994 වර්ෂය සඳහා වෙන්කළ මුදල රු. (නව සහ ක්‍රියාත්මකව පවතින ප්‍රදාන සඳහා)	4.5	3.5	2,059.000	5,92.000	1,600.000
සම්පූර්ණ කළ ප්‍රදාන 1994	08	-	-	-	-
අත්හිටවූ ප්‍රදාන 1994	-	-	-	-	-
නැවැත්වූ ප්‍රදාන 1994	03	-	-	-	-
පත්කළ පර්යේෂණ සහායකයින් 1994	01	-	-	-	-
පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි සංඛ්‍යාව 1994	-	01	02	-	-
පශ්චාත් උපාධි නිබන්ධන 1994	-	-	-	-	-
නව අයදුම්පත් 1995	01	01	-	-	-
1995 සඳහා ඉල්ලා ඇති මුදල් (රු.)	5	2.7	-	-	-
1995 දී අනුමත කළ ප්‍රදාන (මාර්තු දක්වා)	01	01	-	-	-

x වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින්.

3 වන සටහන

1994 වර්ෂයේදී පිරිනමන ලද නව ප්‍රදානයන්

විෂය ක්ෂේත්‍රය : ජීව විද්‍යා

ප්‍රදාන අංකය	ප්‍රදානලාභියාගේ නම / ආයතනය	මාතෘකාව සහ කාල සීමාව	වෙන්කළ මුළු මුදල රු. ශත
